**units**
**08 - 13 - 14**

වා ගී ෂ් ව ර

# 1978 ආණ්ඩුක්‍රමය

- ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ (හැඳින්වීම)
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- ස්ථිර විධායකය
- අධිකරණය
- මූලික අයිතිවාසිකම්
- ඔම්බුඩ්ස්මන්වරයා
- ජනමතවිචාරණය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය

**s u r e k a   w a g e e s h w a r a**

# ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ (හැඳින්වීම)

# 1978

## ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ (හැඳින්වීම)

1. **ඒකීය ආණ්ඩුක්‍රමයක් වීම.**
(N.B - ඒකීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි දක්වන්න)

ශ්‍රී ලංකාව 1978 ආණ්ඩුක්‍රමය ඒකීය ආණ්ඩුක්‍රමයකි. ව්‍යවස්ථාවේ I පරිච්ඡේදයේ 2 වගන්තිය තුළ , **ශ්‍රී ලංකා ජන රජය ඒකීය ජන රජයකි.** යනුවෙන් දක්වා තිබේ. පරිපාලනයේ පහසුව සඳහා පලාත් පාලන ආයතන පිහිටුවා තිබේ. පලාත් සභා - මහ නගර සභා - නගර සභා - ප්‍රාදේශීය සභා නිදසුන් වේ. **පලාත් සභා වලට බලතල පවරා ඇත්තේ ආණ්ඩුක්‍රම** ව්‍යවස්ථාවෙනි. 13 සංශෝධනය ඒ සඳහා භාවිතා කර තිබේ. එය විශේෂිත ලක්ෂණයකි.

2. **සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය මත පදනම් වීම.**
(සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය යනු කුමක්දැයි දක්වන්න)

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩ නැගී ඇත්තේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය මත පදනම් වෙමිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ I පරිච්ඡේදයේ 1 වගන්තිය තුළ , **ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ.** යනුවෙන් දක්වා තිබේ.

3. **මිශ්‍ර ආණ්ඩුක්‍රමයකි.**
(මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න)

1978 ආණ්ඩුක්‍රමය මිශ්‍ර හෙවත් දෙමුහුන් ආණ්ඩුක්‍රමයකි. මෙය ප්‍රංශ ආණ්ඩුක්‍රමය පූර්වාදර්ශයට ගෙන ගොඩ නගා තිබේ. විධායක කටයුතු සඳහා පූර්ණ විධායක ජනාධිපතිවරයෙකු මෙන්ම කැබිනට් මණ්ඩලක් ස්ථාපනය කර තිබේ.

| විධායකය | = | ජනාධිපති | + | කැබිනට් මණ්ඩලය |
|---|---|---|---|---|

4. **අනම්‍ය ආණ්ඩුක්‍රමයකි.**
(ආනම්‍ය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි දක්වන්න)

1978 ආණ්ඩුක්‍රමය සංශෝධන අනම්‍ය පදනමක රඳවා තිබේ. ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 11 , 30(2) , 62(2) වගන්ති හැර සෙසු වගන්ති පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතරයකින් පමණක් සංශෝධනය කළ හැකිය.

**නමුත්,**

ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 11 , 30 (2) , 62 (2) වගන්ති සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතරයට අමතරව ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය අවශ්‍ය වේ.

(N.B) *නමුත් ප්‍රායෝගික තත්ත්වය තුළ මේ වන විට ව්‍යවස්ථාවට සංශෝධන 18 ක් ඒකතු වී තිබේ.*

5. **ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.**
(ලිඛිත ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි පහදන්න)

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත ආණ්ඩුක්‍රමයකි.

6. **ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.**
(ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් යනු කුමක්දැයි පහදන්න)

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. එහි සාමාජිකයින් 225 කි. ආකාර දෙකකට තෝරාපත් කරයි.

7. **ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව උත්තරීතර නොවීම.**
(පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය යනු කුමක්දැයි හඳුන්වාදෙන්න)

1978 පාර්ලිමේන්තුව ස්වාධිපති පාර්ලිමේන්තුවක් නොවේ. ඊට බලපෑ ප්‍රධාන හේතු කිහිපයකි. **නීති සම්පාදනය සඳහා වෙනත් ආයතන පැවතීම. ජනතා පරමාධිපත්‍යය හිමි එකම ආයතනය නොවීම. අධිකරණ ප්‍රති නිරීක්ෂණ බලය.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පූර්ණ බලතල පාර්ලිමේන්තුවට හිමි නොවීම. නීති ස්මාපදනය බලය සීමා කරන වගන්ති පැවතීම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකිවීම.**

8. **ජනතා පරමාධිපත්‍යය.**
(ජනතා පරමාධිපත්‍යය යනු කුමක්දැයි හඳුන්වන්න)

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනතා පරමාධිපත්‍යය ස්ථාපනය කොට තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ I පරිච්ඡේදයේ 3 වගන්තිය තුළ **ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හල නොහැක්කේය. පරමාධිපත්‍යයට පාලන බලතල මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුලත් වන්නේ ය. යනුවෙන් දක්වා තිබේ.**

9. **බහුපක්ෂ ක්‍රමය**

10. **ඔම්බුඩ්ස්මන් ධූරය.**

11. **පාර්ලිමේන්තු සභාව.**

12. **මූලික අයිතිවාසිකම්.**

# ව්‍යවස්ථාදායකය

# ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව.

<u>හැඳින්වීම.</u>

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නිර්මාණය කර ඇති ව්‍යවස්ථාදායක ආයතනය **<u>පාර්ලිමේන්තුවයි</u>**. මෙම පාර්ලිමේන්තුවේ ව්‍යුහය **<u>ඒකමාණ්ඩලික</u>** වේ.

සංයුතිය

පාර්ලිමේන්තුවේ සාමාජික සංඛ්‍යාව **225 කි**. මෙය **ස්ථාවර සංඛ්‍යාවක් ලෙස** ව්‍යවස්ථාගත **කොට තිබේ**. එය විශේෂ ලක්ෂණයකි. මන්ත්‍රීවරු **196** <u>මැතිවරණ කොට්ඨාස</u> වලින් <u>සමානුපාතික නියෝජන</u> ක්‍රමයට අනුව ජනතාව විසින් තෝරාපත් කර ගනී. **29 ක්** <u>ජාතික ලැයිස්තුවෙන් තේරීපත් වේ</u>. **මහමැතිවරණයක දී එක් එක් දේශපාලන පක්ෂ ලබාගත් ඡන්දවල අනුපාතයට අනුව ජාතික ලැයිස්තුවෙන් ඒ ඒ පක්ෂ වලට හිමි මන්ත්‍රීන් ප්‍රමාණය තීරණය වේ.**

**225**

**196**
**ජනතා ඡන්දයෙන්**
**(සමානුපාතික නියෝජන ක්‍රමයේ විවෘත ලැයිස්තු ක්‍රමය)**

**29**
**ජාතික ලැයිස්තුවෙන්**

නිලකාලය

පාර්ලිමේන්තුවේ <u>නිලකාලය</u> වසර **6 කි. නමුත් නිලකාලය අවසන් වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකිය. නමුත් ඒ සම්බන්ධයෙන්** සීමාවන් දක්වා තිබුණි.

- **පාර්ලිමේන්තුව රැස්වී එක් (1) වසරක් ඉක්මයාමට පෙර**
- **ජනාධිපතිවරයාට විරුද්ධව දෝශාභියෝග චෝනදනාවක් කථානායකවරයා වෙත භාර දී ඇති විට.**
- **පාර්ලිමේන්තුව තුළ පළමු වර ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රතික්ෂේප වූ විට.**

පාර්ලිමේන්තුව තුළ කටයුතු මෙහෙය වීම සඳහා මහ මැතිවරණයට පසුව රැස්වන පළමු සභාවාරය තුළ දී **කථානායකවරයෙකු - නියෝජ්‍යය කථානායක වරයෙකු - නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයෙකු** තෝරාගනී. <u>පාර්ලිමේන්තුවේ මුලසුන හොබවනු ලබන්නේ කථානායකවරයා විසිනි.</u> කථානායක තෝරාගැනීම පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ දෙපාර්ශවයේම එකඟතාවය මත සිදු කරයි. කථානායක ධූරයට පත්වූ පසු ඔහු අපක්ෂපාතීව කටයුතු කළ යුතු ය. කථානායකවරයාට සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව තුළ ඡන්ද බලය නොමැත. නමුත් යම් කරුණක් සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ ඡන්ද සමාන වූ විට ඔහුට **තීරක ඡන්දය** භාවිතා කළ හැකිය. ස්ථාවර නියෝග හරහා පාර්ලිමේන්තුව හසුරුවනු ලබන්නේ කථානායකවරයා ය.

- පාර්ලිමේන්තුව සකස් කරන පනත් නීති බවට පත් වන්නේ කථානායකවරයාගේ අවසාන අනුමැතිය ලබා දීමත් සමඟිනි.

- පාර්ලිමේන්තුව කැඳවීම කල්දැමීම විසුරුවා හැරීම සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

- පාර්ලිමේන්තුවේ රැස්වීමක් පැවැත්වීම සඳහා සිටිය යුතු අවම මන්ත්‍රී ප්‍රමාණය (සණ පූර්ණය) මන්ත්‍රීවරු 20 කි.

- පාර්ලිමේන්තුවේ <u>මහලේකම්වරයෙක්</u> ද වන්නේ ය. ඔහු පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. යහ පැවැත්මෙන් කටයුතු කරන තාක් කල් ධූර දැරිය හැකි බව ව්‍යවස්ථාවේ සඳහන් වේ.

- පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුගේ අසුන් හිස්වන අවස්ථා කිහිපයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වේ. **මන්ත්‍රීවරයෙකු මිය ගිය විට - ඉල්ලා අස්වූ විට - පාර්ලිමේන්තුවේ අවසරය නොලබා මාස තුනකට වැඩි කාලයක් පාර්ලිමේන්තුවේ සභාවර වලට නොපැමිණීම - මන්ත්‍රීවරයෙකු ප්‍රජා අක්ෂනුතාවයට පත් කළ විට.**

## ● <u>කාර්ය හා බලතල.</u>

### (i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.</u>

★ ව්‍යවස්ථාදානය

පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කරයි. **මුදල් හා සාමාන්‍යය නීති** යන නීති වර්ග දෙකම සම්පාදනය කිරීමට බලතල තිබේ.

(N.B) *ව්‍යවස්ථාදායකය යනු ජනතාව වක්‍රාකාරයෙන් නීති සම්පාදනය සඳහා සම්බන්ධවන ක්‍රියාවලියයි. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය තුළ නීති සම්පාදනය සඳහා ජනතාව සෘජුව සම්බන්ධ වන ජනමත විචාරණ ක්‍රියාවලියක් ද පවතී.*

★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**පාර්ලිමේන්තුවේ (2/3) ක විශේෂ බහුතරයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 11 , 30 (2) , 62 (2) යන වගන්ති හැර සෙසු වගන්ති සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුවට බලය තිබේ.

**පාර්ලිමේන්තුවේ (2/3) ක විශේෂ බහුතරයකින් හා ජනමත විචාරනයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම හා නව ව්‍යවස්ථාවක් පැනවීමට හැකිය.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති, 1 (රාජ්‍ය) - 2 (ජන රජයේ ඒකීය භාවය) - 3 (ජනතාවගේ පරමාධිපත්‍යය) - 6 (ජාතික කොඩිය) - 7 (ජාතික ගීය) - 8 (ජාතික දිනය) - 9 (බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනැමීම) - 10 (සිතීමේ නිදහස හා පක්ෂයේ ආගමික නිදහස) - 11 (වදහිංසාවලින් නිදහස්වීම) - 30(2) ජනාධිපතිගේ නිලකාලය - 62(2) පාර්ලිමේන්තුවේ නිලකාලය. යන වගන්ති පාර්ලිමේන්තුවේ 2/3 විශේෂ බහුතර අනුමැතිය සහ ජනමත විචාරණයකින් සංශෝධනය කල හැකිය.

### (ii) <u>විධායක අංශයේ කාර්ය හා බලතල</u>

★ විධායකය පාලනය හා මෙහෙය වීම.

1978 ආණ්ඩුක්‍රමය මිශ්‍ර ආණ්ඩුක්‍රමයකි. විධායකයේ සංයුතිය වන්නේ ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි.

| | | | | |
|---|---|---|---|---|
| විධායකය | = | ජනාධිපති | + | කැබිනට් මණ්ඩලය |

ජනාධිපතිවරයා සෘජුව ජනාධිපතිවරණයකින් ජනතාව විසින් තෝරාපත් කරයි. කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකය තුළින් තෝරා පත් කරයි. එම නිසා කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී. එසේ වග නොකියන විට විශ්වාස භංගයෝජනාවකින් කැබිනට්ටුව ඉවත් කිරීමට ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට හැකිය. **එම නිසා කැබිනට් මණ්ඩලය පාලනයට හා මෙහෙයවීමට පාර්ලිමේන්තුවට හැකි ය.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වගන්තිය තුළ ජනාධිපති වරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතු බව දක්වා තිබේ. නමුත් එය අක්‍රිය වගන්තියකි. එම නිසා පාර්ලිමේන්තුව තුළ සම්මත කරනු ලබන විශ්වාස භංග යෝජනාවකින් ජනාධිපතිවරයා ඉවත් කළ නොහැකිය. ඒ අනුව සෘජුව ජනාධිපතිවරයා පාලනය කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකිය. ජනාධිපතිවරයා ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකය තුළ දෝශාභියෝග චෝදනාවක් සම්මත කළ යුතු ය. එය දැඩි අනම්‍ය ක්‍රියාමාර්ගයකි. 1978 ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථා ඉතිහාසය තුළ දෝශාභියෝග චෝදනාව ඉදිරිපත්ව ඇත්තේ එක් අවස්ථාවක දී පමණි. ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයාටය. නමුත් එය ද සම්මත වූයේ නැත. මෙම තත්ත්වය අනුව ජනාධිපතිවරයා වන පූර්ණ විධායකය මෙහෙයවීමට හා පාලනයට පාර්ලිමේන්තුව සෘජුව නොහැකි බව තහවුරු වේ.

(iii) මූල්‍යමය බලතල.

පාලන කටයුතු සඳහා ආණ්ඩුවට අවශ්‍ය මුදල් ලබා ගැනීමට හා වියදම් කිරීමට සිදු වන්නේ ව්‍යවස්ථාදායකයේ අනුමැතිය මතය. මුදල් නීති සම්පාදනය කිරීමට බලය ඇත්තේ ව්‍යවස්ථාදායකයට පමණි. අයවැය ලේඛනය අනුමත කිරීම ව්‍යවස්ථාදායකය විසින් සිදු කිරීම , බදු සම්බන්ධයෙන් තීරණ ගැනීම , ආදී මුදල් බලතල ව්‍යවස්ථාදායකය සතු වේ.

(iv) මහජනතාවගේ දුක්ගැනවිලි සොයා බැලීම.
(v) මන්ත්‍රිවරු පුහුණු කිරීම (අනාගත නායකයින් පුහුණු කිරීම)
(vi) ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්මත කිරීම.
(vii) ආණ්ඩුවට අවශ්‍ය බහුතරය සැපයීම.

1978 ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ (ස්වාධිපත්‍යය) පරමාධිපත්‍යය.

- පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය) අර්ථ නිරූපණය.

**"ස්වාධිපත්‍යය පාර්ලිමේන්තුවක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෙනත් ආයතනවල බලපෑමකින් හෝ සීමාවකින් තොරව නීති සම්පදනයට හැකියාව ඇති පාර්ලිමේන්තුවක්ය."**

**"ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවේ අභිමතයට අනුව ඕනෑම නීතියක් සම්පාදනයට සංශෝධනයට - නිශේධ කිරීමට පාර්ලිමේන්තුව සතු පරම සහ අසීමිත අධිකාරී බලය පාර්ලිමේන්තු පරමාධිපත්‍යය යන්නෙන් සංකේතවත් වේ."**

- ස්වාධිපත්‍යය නොමැති පාර්ලිමේන්තුවක හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.

  - නීති සම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සමාන හෝ උසස් ආයතන පැවතීම.
  - ව්‍යස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමාකරන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තළ දැක්වීම.
  - ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලයට බලපෑම් කිරීමට හැකිවීම.

- **1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම පව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය) පාර්ලිමේන්තුවක් නොවේ.**

**නිදර්ශන,**

**(i) නීති සම්පාදන බලයට බලපෑම් පැවතීම.**

★ අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය.

පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලයට ශ්‍රේෂ්ඨාධිකරණයට බලපෑම් කළ හැකිය. පාර්ලිමේන්තුව සකස් කරන පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකුල භාවය පරීක්‍ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය. පාර්ලිමේන්තුව සකස් කරන පනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංගණය වන්නේ නම් එවැනි පනත් නිශේධ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය නිසා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාධාන කෘත්‍යය බලපෑමකින් තොරව සිදු කළ නොහැකිය. එම නිසා පාර්ලිමේන්තුව ස්වාධිපත්‍යය පාර්ලිමේන්තුවක් නොවේ.

★ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනධිපතිවරයා සතු වීම.

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතු කර තිබේ. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට පරිබාහිර පුද්ගලයෙකි. එම නිසා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා ස්වකිය ධූරය අහිමි නොවේ. එසේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමේ බලය ලබා දීම නිසා පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය අහිමි වී තිබේ. එසේම බොහෝ ජනාධිපතිවරු මෙම බලය උපක්‍රමිකව භාවිතා කරමින් ව්‍යවස්ථාදායකය විධායකය වෙත අවනත කරගත්තේ ය. එම නිසා ව්‍යවස්ථාදායකය විධායකයේ ආධිපත්‍යයට යටත් වේ. එම නිසා ව්‍යවස්ථාදායකයේ ස්වාධිපත්‍යය අහිමි වී ගියේ ය.

**(ii) නීති සම්පාදන බලයට සීමාවන් පැවතීම.**

පාර්ලිමේන්තුවට නීති සම්පාදන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වගන්තිය මගින් ලබා දී තිබේ. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වගන්තිය මගින් නීති සම්පාදන බලයට සීමාවක් පනවා තිබේ.

**(iii) නීති සම්පාදනය සඳහා පාර්ලිමේන්තුව හැර වෙනත් ආයතන පැවතීම.**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය තුළ නීති සම්පාදනය කිරීම සඳහා පාර්ලිමේන්තුව හැර **ජනමත විචාරණයක්** භාවිතා කළ හැක්කේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන නීතියක් හැර ඕනෑම නීතියක් ජනමත විචාරණ මගින් සම්පාදනය කළ හැකිය. එම නිසා පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය අහිමි වී තිබේ.

**(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ පූර්ණ බලතල ව්‍යවස්ථාදායකය සතු නොවීම.**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. එම නිසා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ පූර්ණ බලතල ව්‍යවස්ථාදායකය සතු නොවේ. ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 11 , 30(2) , 62(2) යන වගන්ති සංශෝධනය කිරීම සඳහා ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය ද අවශ්‍ය වේ. ඒ අනුව ද පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය අහිමි වී තිබේ.

# ජ නාධිපතිවරයා.

හැඳින්වීම.

කවුද?

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ජනාධිපතිවරයා පූර්ණ විධායකය වන්නේ ය. 30 (1) වගන්තියට අනුව ජනාධිපතිවරයා **රාජ්‍ය නායකයා - විධායකයේ ප්‍රධානියා - ආණ්ඩුවේ නායකයා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා** වන්නේ ය.

සුදුසුකම්

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනාධිපති අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමට අදාළ සුදුසුකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් කර තිබේ.

(i) **ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.**
(ii) **වයස අවුරුදු 30 සම්පූර්ණ වීම.**
(iii) **පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරීපත්වීමට සුදුසු පුද්ගලයෙකු වීම.**
(iv) **දෝශාභියෝග චෝදනාවකින් ජනාධිපති ධූරයෙන් ඉවත් කළ අයෙක් නොවීම.**
(v) **දෝශ ද්‍රෝහී නොවීම.**
(vi) **දෙවරක් ජනාධිපතිවරයෙකු ලෙස තේරීපත් වූ අයෙකු නොවිය යුතු යැයි සුදුසුකමක් පැවතිය ද 18 වැනි සංශෝධනය මගින් එම සීමා ඉවත් කර ඕනෑම වාර සංඛ්‍යාවක් ඉදිරිපත්වීමට අවකාශය ලබා දුනි.**

මැතිවරණයට ඉදිරිපත්විය හැකි ආකාරය

ජනාධිපතිධූර අපේක්ෂකයෙකුට මැතිවරණයට ඉදිරිපත් විය හැකි ආකාර දෙකක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් කර තිබේ.

(i) **පිළිගත් දේශපාලන පක්ෂයකින්**
(ii) **ස්වාධීනව.**

(N.B) *ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන්නේ නම් එම පුද්ගලයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස සිටින හෝ සිටි අයෙක් විය යුතු ය.*

නිලකාලය

1978 යටතේ පිහිටුවන ලද පූර්ණ විධායක ජනාධිපති ධූරයේ නිල කාලය වසර 6 කි. නමුත් ජනාධිපති ධූරයේ වසර 6 ඉක්මයාමට පෙර ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කළ හැකිය. ඒ **දෝශාභියෝග චෝදනාවක් මගිනි.**

වැටුප්

ජනාධිපතිවරයාගේ වැටුප් , දීමනා , විශ්‍රාම වැටුප් පාර්ලිමේන්තුව මගින් තීරණය කරනු ලබයි. ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබයි. සේවා කාලය තුළ වැටුප් අඩු කළ නොහැකිය.

ජනාධිපතිවරු

1978 තුළ දී ජේ. ආර්. ජයවර්ධන මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරමින් ලංකාවේ ප්‍රථම පූර්ණ විධායක ජනාධිපතිවරයා බවට පත් විය. රණසිංහ ප්‍රේමදාස , ඩී.බී. විජේතුංග ,චන්ද්‍රිකා බණ්ඩාරණායක , මහින්ද රාජපක්ෂ ආදී ජනාධිපතිවරුන් ජනාධිපතිධූරය හොබවා තිබේ.

වෙනත්

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

| ජනාධිවරයා තෝරාපත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙත. |
|---|

## ජනාධිපතිවරණය

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පූර්ණ විධායක ජනාධිපතිවරයා තෝරපත් කර ගනු ලබන්නේ **ජනාධිපතිවරණයක්** මගිනි. මුළු ලංකාවම එකම ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකමින් ජනාධිපති වරණය පවත්වයි. ජනාධිපතිවරයා ලෙස තේරී පත්වීමට ප්‍රකාශිත මුළු ඡන්ද සංඛ්‍යාවෙන් ඒකාන්තර බහුතරයක් (50% ක්) ලබාගත යුතු ය. ජනාධිපතිවරණය පවත්වනු ලබන්නේ **මැතිවරණ සේවා කොමිෂන් සභාව** විසිනි.

- **ජනාධිපති ලෙස තේරීපත්වීම සඳහා 50% ක් (ඒකාන්තර බහුතරයක්) ඡන්ද ලබා ගැනීමේ අවශ්‍යතාවයමත මනාප ක්‍රමයක් නිර්මාණය කර තිබේ.**

උදා :- ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයින් දෙදෙනෙක් පමණක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක්,

ජනාධිපති අපේක්ෂකයින් ලෙස තරඟකරුවන් දෙදෙනෙක් පමණක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී ඡන්ද දායකයන්ට තමා කැමති අපේක්ෂකයාට ඡන්දය ලබාදිය හැකිය.

දළ සටහන

| | |
|---|---|
| A අපේක්ෂකයා | X |
| B අපේක්ෂකයා | |

මෙම ආකාරයට අපේක්ෂකයින් දෙදෙනෙක් ඉදිරිපත් වී ඇති විට තමන් කැමති අපේක්ෂකයාට ඡන්දය ඉතා පහසුවෙන් ප්‍රකාශ කළ හැකිය. අපේක්ෂකයින් දෙදෙනෙක් පමණක් ඉදිරිපත් වී ඇති නිසා එක් අපේක්ෂකයෙකුට ඉතා පහසුවෙන් (50%) සීමාව පසු කළ හැකිය. ඡන්ද සමාන වුවහොත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් කුසපත් ඇදීමකින් ජනාධිපතිවරයා තෝරා ගනී.

උදා :- ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයින් තිදෙනෙක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක්.

ජනාධිපති අපේක්ෂකයන් ලෙස තරඟ කරුවන් තිදෙනෙක් ඉදිරිපත් වී ඇති විටදී මැතිවරණය තරමක් සංකීර්ණ වේ. තරඟ කරුවන් තිදෙනෙක් තරඟ කරන නිසා එක් අයකුටවත් (50%) ඡන්ද සීමාව පසුකිරීමට නොහැකි විය හැකිය. එම නිසා ඡන්ද දායකයන්ට මනාප දෙකක් ලබාදෙයි. "1 මනාපය" තමා මුලින්ම කැමති අපේක්ෂකයාට ද "2 මනාපය" ඊට පසුව කැමති අපේක්ෂකයාට ද ලබාදිය හැකිය.

දළ සටහන

| | |
|---|---|
| A අපේක්ෂකයා | 1 |
| B අපේක්ෂකයා | 2 |
| C අපේක්ෂකයා | |

මෙම ආකාරයට අපේක්ෂකයින් තිදෙනෙක් ඉදිරිපත් වූ විට පළමු වටයේ දී ඔවුන්ගේ පළමු මනාපය ගණන් කරනු ලබයි. එහි දී එක් අපේක්ෂකයෙකු (50%) ක් ඒකාන්තර බහුතරයක් ඡන්ද ලබාගෙන ඇත්තේ නම් ඔහු ජනාධිපති වරයා ලෙස තේරී පත් වන්නේ ය. නමුත් එක් අපේක්ෂකයෙකුවත් 50% ක් ඡන්ද ලබාගෙන නොමැති නම් වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂකයින් දෙදෙනා රඳවාගෙන අනෙක් අපේක්ෂකයා තරඟයෙන් ඉවත් කරයි. ඉවත් කරන ලද අපේක්ෂකයාගේ දෙවන මනාප ලබා දී ඇති පිළිවෙලින් ඉතිරිකර ගත් අපේක්ෂකයින්ගේ ප්‍රමාණයට එකතු කරයි. එවිට යම් අපේක්ෂකයෙකු (50%) ක් ඡන්ද ප්‍රමාණය ලබාගෙන ඇත්නම් ඔහු ජනාධිපතිවරයා වේ.

උදා :- ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයින් තිදෙනෙකුට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්වී ඇති අවස්ථාවක්.

ජනාධිපති අපේක්ෂකයින් ලෙස තරඟ කරුවන් තිදෙනෙකුට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්වී ඇති වීම මැතිවරණය දැඩි සංකීර්ණ ස්වභාවයක් ගනී. තරඟ කරුවන් ප්‍රමාණය වැඩි නිසා එක් අපේක්ෂකයෙකුටවත් (50%) ඒකාන්තර බහුතර ඡන්ද ප්‍රමාණයක් නොලැබී යා හැකිය. එම නිසා එවැනි අවස්ථාවක දී ඡන්ද දායකයන්ට මනාප තුනක් ලබාදෙයි.

1 මනාපය - 2 මනාපය - 3 මනාපය ලෙස එය හඳුන්වයි.

දළ සටහන

| | |
|---|---|
| A අපේක්ෂකයා | (1) |
| B අපේක්ෂකයා | (2) |
| C අපේක්ෂකයා | (3) |
| D අපේක්ෂකයා | |
| E අපේක්ෂකයා | |

මෙම ආකාරයට අපේක්ෂකයින් තිදෙනෙකුට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති විට ද පළමු වටය තුළ දී පළමු (1) මනාපය ගණන් කරනු ලබයි. යම් අපේක්ෂකයෙකු 50 % ක් ඡන්ද ලබාගෙන ඇත්නම් ඔහු ජනාධිපතිවරයා ලෙස තෝරා ගනී. කිසිදු අපේක්ෂකයෙකු 50% ක් ඡන්ද ලබා ගෙන නොමැති නම් වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂකයින් දෙදෙනා ඉතිරිකර ගෙන අනෙක් අපේක්ෂකයින් තරඟයෙන් ඉවත් කරයි. ඉවත් කළ අපේක්ෂකයන්ගෙන් දෙවන මනාපය දැනට තරඟ වදින අපේක්ෂකයින්ට වේ නම් එම මනාප ඔවුන්ට එකතු කරයි. එවිට යම් අපේක්ෂකයෙකු 50% ක් ඡන්ද ලබාගත්තේ නම් ඔහු ජනාධිපතිවරයා ලෙස තෝරාගනී. එවිට ද එක් අපේක්ෂකයෙක් වත් 50% ක් ඡන්ද ලබාගෙන නොමැති නම් ඉවත් කළ අපේක්ෂකයින්ගේ (3) තෙවන මනාපය දැනට තරඟ කරන අපේක්ෂකයන්ට වේ නම් එම ඡන්ද ඔවුන්ට එකතු කරයි. එවිට 50% ක් ඡන්ද ලබාගත් පුද්ගලයා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කරයි. ඡන්ද ප්‍රමාණය සමාන වුවහොත් කුසපත් ඇදීමකින් ජනාධිපති වරයා තෝරාගනී.

(N.B) *50% ක් ලැබූ අපේක්ෂකයා ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරයා හෝ එම ආයතනයේ වෙනත් විනිශ්චයකාරවරයෙක් ඉදිරියේ දිවුරුම් දී ධුරයේ වැඩ භාරගත යුතු ය.*

• <u>1978 දෙවන ජන රජ ආණ්ඩුක්‍රමය තුළ පවත්වන ලද ජනාධිපතිවරණ පිළිබඳ දත්ත</u>.

| මැතිවරණ | වර්ෂය | ජනාධිපතිවරයා | ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|---|
| I | 1982 | ජේ.ආර්. ජයවර්ධන මහතා | 52.91% |
| II | 1989 | ආර්. ප්‍රේමදාස මහතා | 50.43% |
| III | 1994 | චන්ද්‍රිකා බණ්ඩාරණායක මහත්මිය | 62.00% |
| IV | 1999 | චන්ද්‍රිකා බණ්ඩාරණායක මහත්මිය | 51.22% |
| V | 2005 | මහින්ද රාජපක්ෂ මහතා | 50.02% |
| VI | 2010 | මහින්ද රාජපක්ෂ මහතා | 57.78% |

<u>මෙම ආකාරයට ජනාධිපතිවරණය හයකදීම පළමු වටයේ දී ජනාධිපතිවරයා තෝරා ගැනීමට හැකිවිය.</u> එම නිසා ලංකාවේ පවත්වන ලද ජනාධිපති මැතිවරණ තුළ දී , දෙවන , තෙවන මනාප ගණන් කිරීමක් සිදු කර නොමැත.

## ජනාධිපතිවරයාගේ කාර්ය හා බලතල

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම <u>ව්‍යවස්ථාවේ 33 වගන්තිය ජනාධිපතිවරයාගේ කාර්ය හා බලතල සටහන් කර තිබේ</u>. ඒ අනුව ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ යන අංශ සතු බලතල විශාල ප්‍රමාණයක් භුක්තිවිඳී.

• <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.</u>

(i) **පාර්ලිමේන්තුව කැඳවීම , කල් දැමීම , විසුරුවා හැරීම.** (70 වගන්තිය)

1978 ආණ්ඩුක්‍රමයට අනුව ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව කැඳවීම, කල් දැමීම හා විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතු වන්නේ ය. නමුත් මෙම කාර්ය හා බලතලය සීමාවන් පවතින්නේ ය.

සීමාවන්,

- පාර්ලිමේන්තුව රැස්වී එක් වසරක් ඉක්මයාමට පෙර,
- ජනාධිපතිවරයාට විරුද්ධව දෝශාභියෝග චෝදනාවක් ඉදිරිපත් ව ඇති විට.
- පාර්ලිමේන්තුව රැස්වී එක් වර්ෂයක් ඉක්ම යාමට පෙර
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පළමුවර පාර්ලිමේන්තුවේ දී ප්‍රතික්ෂේප වූ විට.

(**N.B**) *නමුත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් ඉල්ලා සිටි විට හෝ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය දෙවන වරට ද පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළ විට පළමු වර්ෂය තුළ දී වුවද පාර්ලිමේන්තුව විසුරුවිය හැකිය.*

(ii) **පාර්ලිමේන්තුව පාලනය කිරීමට, මෙහෙය වීමට හා අවනත කර ගැනීම මගින් නීති සම්පාදනය කරවා ගැනීම.**

ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය සහිත නිසා ස්වකීය අභිමතය පරිදි ව්‍යවස්ථාදායකය පාලනය හා මෙහෙය වීමට හැකිවේ. ඒ හරහා තමාට අවශ්‍ය නීති ව්‍යවස්ථාදායකයට බලපෑම් කරමින් සකස් කර ගත හැකිය. ජනාධිපතිවරයාගේ පක්ෂයේම පාර්ලිමේන්තුවක් පවතින්නේ නම් ජනාධිපතිවරයාට සෘජුවම ස්වකීය අභිමතය මත පාර්ලිමේන්තුව හැසිරවිය හැකිය. නමුත් ජනාධිපතිවරයාට විරුද්ධ පක්ෂයක පාර්ලිමේන්තුවක් ඇති විට එනම් සහ හැසිරීමක් පවතින විට උක්ත තත්ත්වයන් වෙනස්විය හැක.

(iii) **ජනමත විචාරන කැඳවීමේ බලය.**

ජනාධිපතිවරයාට ජනමත විචාරණ කැඳවීමේ බලය හිමි වන්නේ ය. ජනමත විචාරණ කැඳවීම මගින් තමාට අවශ්‍ය නීති ජනතාව හරහා සකස් කර ගැනීමට ජනාධිපතිවරයාට හැකිය. <u>නමුත් එම නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නක් නොවිය යුතු ය</u>.

(iv) **විශේෂ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම.**

සාමාන්‍යය තත්ත්වය තුළ ව්‍යවස්ථාදයකයේ මුලසුන දරනු ලබන්නේ කථානායක වරයාය. නමුත් විශේෂ අවස්ථාවල දී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීමේ බලය ජනාධිපතිවරයා සතු වන්නේ ය. මංගල සභාවාරය නිදසුනකි.

(v) **පාර්ලිමේන්තුව ඇමතීම හා පණිවුඩ යැවීම.**

18 වැනි සංශෝධනයට අනුව තුන් (03) මාසයකට වරක් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පැමිණීම අනිවාර්ය වන්නේ ය. ඒ හැර ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුවට පැමිණීමට ජනාධිපතිවරයාට හැකිය. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව තුළ ඡන්ද බලය හිමි නොවේ. ඒ හැර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු භුක්ති විඳින සියළු වරප්‍රසාද ජනාධිපති වරයාට හිමි වේ.

(vi) **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අමාත්‍යය පදවි පිරිනැමීම.**

ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අමාත්‍යය පදවි පිරිනමයි. වැඩි පිරිසකට අමාත්‍යය පදවි පිරිනැමීම මත ඔවුන් තමා වෙත අවනත කර ගනී. එමගින් පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා වෙත අවනත කර ගැනීමට උත්සාහ දරයි.

(**N.B**) *ජනාධිපතිවරයාගේ දේශපාලන පක්ෂය ව්‍යවස්ථාදායක බලය දිනාගෙන ඇති විට අමාත්‍ය පදවි පිරිනැමීම මගින් ව්‍යවස්ථාදායකය අවනත කර ගත හැකි ය. නමුත් විරුද්ධ පක්ෂ පාර්ලිමේන්තුවක් පවතින විට එම පක්ෂයෙන් අමාත්‍යධූර පත් කිරීමට සිදුවේ. එවිට ජනාධිපතිවරයාට අවශ්‍ය ආකාරයට පාර්ලිමේන්තුව අවනත කරගත නොහැකිය.*

● විධායක අංශයේ කාර්ය හා බලතල.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මිශ්‍ර ආණ්ඩුක්‍රමයකි. විධායකය සමන්විත වන්නේ ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකිනි.

**විධායකය = ජනාධිපති + අගමැති + අමාත්‍යය මණ්ඩලය**

**(අගමැති + අමාත්‍යය මණ්ඩලය) = කැබිනට් මණ්ඩලය**

විධායකයේ ප්‍රධානියා, ආණ්ඩුවේ නායකයා , රාජ්‍යය නායකයා හා සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වන්නේ ජනාධිපති වරයාය. ජනාධිපතිවරයාට අති විශාල විධායක බලතල ප්‍රමාණයක් හිමි වේ.

(i) **අගමැති පත් කිරීම.**

පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය දිනාගෙන ඇති මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අගමැති වරයා ලෙස පත් කළ යුත්තේ ය.

(N.B) *ජනාධිපතිවරයාගේම පක්ෂය ව්‍යවස්ථාදායකය තුළ බහුතර බලය දිනාගෙන ඇති විට තම පක්ෂයෙන් අගමැතිවරයා තෝරාපත් කරයි. එවිට බොහෝ විට තමන් පක්ෂයේ නායකයා බැවින් පක්ෂයේ දෙවෙනි නායකයා අගමැති ධූරයට තෝරාපත් කරයි. ජනාධිපතිට පක්ෂයේ දෙවැනි නායකයා අගමැති ලෙස පත් නොකොට පසුපෙළ නායකයෙක් අගමැතිවරයා ලෙස තෝරාපත් කළ හැකිය. කිසිවකු ඊට විරුද්ධ නොවේ. ඊට හේතු වන්නේ පක්ෂ නායකයාගේ තීරණයක් නිසාවෙනි.*

*නමුත් විරුද්ධ පක්ෂයට පාර්ලිමේන්තුවේ බලය හිමි වී ඇත්නම් එම පක්ෂයේ නායකයා අගමැති ලෙස තෝරාපත් කළ යුතු ය.*

(ii) **අමාත්‍යය මණ්ඩලය පත් කිරීම.**

අමාත්‍යවරුන් පත් කිරීම , මාරු කිරීම , ඉවත් කිරීම, ඔවුන්ගේ විෂයන් තීරණය කිරීම ජනාධිපතිවරයා සතු විධායක කාර්යකි. ව්‍යවස්ථාදායකය තුළින් අමාත්‍යය මණ්ඩලය තෝරාපත් කළ යුතු ය. ජනාධිපති වරයාට තමන් අභිමත ඕනෑම අමාත්‍යාංශ ප්‍රමාණයක් තමා සතුව තබාගත හැකිය.

(N.B) *තමන්ගේ පක්ෂයෙන් අමාත්‍යය මණ්ඩලය තෝරාපත් කරන්නේ නම් අගමැතිවරයාගේ උපදෙස් නොවිමසා එම තෝරාපත් කිරීම සිදු කළ හැකිය. අවශ්‍ය නම් අගමැතිවරයාගෙන් විමසිය හැකිය.*

(N.B) *නමුත් විරුද්ධ පක්ෂයෙන් අමාත්‍යය මණ්ඩලය තෝරාපත් කරන්නේ නම් එම පක්ෂයෙන් අගමැතිවරයා පත් කොට ඔහුගේ උපදෙස් මත අමාත්‍යය මණ්ඩලය තෝරා පත් කිරීමට සිදු වේ.*

(iii) **ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම.**

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කරනු ලබන්නේ ජනාධිපති වරයා ප්‍රමුඛ අමාත්‍යය මණ්ඩලය විසිනි. එම ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුව තුළ කියවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

(iv) **හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම.**

හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු ය. ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ හදිසි අවස්ථාව පාර්ලිමේන්තුව විසින් දින 10 ක් ඇතුළත අනුමත කළ යුතු ය. නැතහොත් දින 14 කින් පසු හදිසි අවස්ථාව නිර්බල වන්නේ ය.

(v) **රජයේ උසස් නිලධාරීන් පත් කිරීම.**

නීතිපති , විගණකාධිපති , ඔම්බුඩ්ස්මන් වරයා , පාර්ලිමේන්තු මහ ලේකම් යන උසස් රාජ්‍ය නිලධාරීන් ජනාධිපතිවරයා විසින් පත් කරයි. එම පත් කිරීම් පාර්ලිමේන්තු සභාව නිරීක්‍ෂණය කළ යුතු ය.

(vi) **කොමිෂන් සභාවන්ට සාමාජිකයින් තෝරා පත්කිරීම.**

මැතිවරණ සේවා කොමිෂන් සභාව , රාජ්‍යය සේවා කොමිෂන් සභාව , ජාතික පොලිස් කොමිෂන් සභාව , ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව , අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව , මුදල් කොමිෂන් සභාව , සීමා නිර්ණය කොමිෂන් සභාව යන කොමිෂන් සභා පත් කිරීම. මෙම පත් කිරීම් ජනාධිපති විසින් සිදු කරනු ලබයි. 18 වැනි සංශෝධනයට අනුව ඒ සඳහා පාර්ලිමේන්තු සභාව ජනාධිපතිට උපදෙස් ලබා දිය යුතු ය.

(vii) **පොලිස්පති පත් කිරීම.**

පොලිස්පතිවරයා පත් කිරීම ජනාධිපතිවරයාට ස්වාධීනව සිදු කළ හැකිය. 17 වැනි සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එම පත් කිරීම අනුමත කළ යුතු ව තිබුණ ද 18 වැනි සංශෝධනය මගින් එය ඉවත් කළේ ය.

(viii) රාජ්‍ය මුද්‍රාව ලඟ තබා ගැනීම.
(ix) යුද්ධය හා සාමය ප්‍රකාශයට පත් කිරීම.
(x) රජයේ උසස් නිලධාරීන් පත් කිරීම.
(xi) විශ්වවිද්‍යාල සඳහා කුළපතිවරු - උපකුලපතිවරු පත් කිරීම.
(xii) ත්‍රිවිධ හමුදාපතිවරු පත් කිරීම.
(xiii) සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වීම.
(xiv) අන්තර්ජාතික සමාජය තුළ ලංකාව නියෝජනය කිරීම.
(xv) තානාපතිවරු පත් කිරීම හා පත්කර එවන ලද තානාපතිවරු පිළිගැනීම.
(xvi) රාජ්‍ය ධූතයන් පත් කිරීම හා පත්කර එවන ලද ධූතයන් පිළිගැනීම.
(xvii) ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය මෙහෙය වීම.
(xviii) විදේශීය ගිවිසුම් වලට එළඹීම.
(xix) පළාත් සභාවල ආණ්ඩුකාරවරු පත් කිරීම.

- <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල.</u>

(i) **උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම.**

ශ්‍රේෂ්ඨාධිකරණය , අභියාචනාධිකරණය , මහාධිකරණය වැනි උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම. මෙම පත් කිරීම් පාර්ලිමේන්තු සභාව නිරීක්‍ෂණය කළ යුතු ය.

(ii) **අග්‍රවිනිශ්චකාරවරයා පත් කිරීම.**

අග්‍රවිනිශ්චකාරවරයාගේ පත් කිරීම 18 වැනි සංශෝධනයට අනුව පාර්ලිමේන්තු සභාව විසින් නිරීක්‍ෂණය කළ යුතු ය.

(iii) **නීතිපතිවරයා පත් කිරීම.**

නීතිපතිවරයාගේ පත් කිරීම ද 18 වැනි සංශෝධනයට අනුව පාර්ලිමේන්තු සභාව විසින් නිරීක්ෂණය කළ යුතු ය.

(iv) **අධිකරණ සේවා කොමිසන් සභාවේ සාමාජිකයින් පත් කිරීම.**

මෙම පත් කිරීම ද 18 වැනි සංශෝධනයට අනුව පාර්ලිමේන්තු සභාව විසින් නිරීක්ෂණය කළ යුතු ය.

(v) **වරදකරුවන්ට සමාව දීම.**

ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයක් විසින් වරදකරුවකු කළ අයකුට සමාව දීමේ බලය ජනාධිපතිවරයා සතු වන්නේ ය.

● <u>චාරිත්‍රානුකූල බලතල</u>

(i) නඩු පැවරීමෙන් නිදහස් වීම.
(ii) නම්බුනාම ප්‍රදානය කිරීම.
(iii) ජාතික වශයෙන් වැදගත් උත්සව වල මුලසුන දැරීම.
(iv) ජාතිය ඇමතීම.

ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායක , විධායක අධිකරණ යන ත්‍රිවිධ ආයතන සතුව විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් හිමි වේ.

□ **<u>ජනාධිපතිවරයා තවදුරටත් බලවත් වීමට බලපෑ හේතු.</u>**

01. සෘජුව මහජන ඡන්දයෙන් තෝරාපත් කර ගැනීම සහ ඒ තුළ නියත බහුතරයක් ලබා ගැනීම.

02. ජනාධිපතිවරයා ඉවත් කරන දෝශාභියෝගය දැඩි අනම්‍යය ස්වභාවයක් ගැනීම.

03. ප්‍රායෝගික තලය තුළ පාර්ලිමේන්තුවට වග නොකීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වගන්තිය තුළ ජනාධිපති වරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු බව දක්වා තිබුණ ද එය අක්‍රීය වගන්තියක් බවට පත්ව තිබීම.

04. නඩු පැවරීමට නොහැකි වීම. (විශේෂ අධිකරණ මුක්තිය)

නිල තත්වයෙහිලා හෝ පෞද්ගලික තත්වයෙහිලා කරන ලද හෝ නොකර හරින ලද කිසිදු කරුණක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නඩු පැවරිය නොහැකි ය.

ස්වකීය පක්ෂයේ පාර්ලිමේන්තුවක් පවතින විට ජනාධිපතිවරයා තවදුරටත් බලවත් වේ. නමුත් ජනාධිපතිවරයාගේ පක්ෂයටම විරුද්ධ පක්ෂයක පාර්ලිමේන්තුවක් පවතින විට ජනාධිපතිවරයාගේ බලය සීමාවකට ලක් වේ. ජනාධිපතිවරයා විරුද්ධ පක්ෂ පාර්ලිමේන්තුවකට මුහුණදීම හඳුන්වනු ලබන්නේ **<u>සහ හැසිරීම්</u>** තත්ත්වයක් ලෙසිනි.

**නිදර්ශන** -: 2001 - 2004 කාලය තුළ එක්සත ජාතික පක්ෂ පාර්ලිමේන්තුව සමඟ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය කටයුතු කළ අවධිය.

## ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කරන ආකාරය.

ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 06 කි. නමුත් නිලකාලය අවසන්වීමට පෙර ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කළ හැකිය. ඒ සඳහා භාවිත කරනු ලබන උපක්‍රමය වන්නේ **දෝශාභියෝග චෝදනාවක්** ව්‍යවස්ථාදායකය තුළ සම්මත කිරීමයි. දෝශාභියෝග චෝදනාව සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 **(II)** උප වගන්තිය තුළ විධි විදාන සටහන් කර තිබේ.

- ජනාධිපතිවරයාට එරෙහි දෝශාභියෝග චෝදනාවක් ගෙන ඒම සඳහා පහත සඳහන් එක් චෝදනාවක් හෝ පැවතිය යුතු ය.

  (i) **මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළීම.**
  (ii) **චරිත දූෂණය.**
  (iii) **අල්ලස් හෝ වෙනත් දූෂණ.**
  (iv) **රාජ්‍යය ද්‍රෝහී වීම.**
  (v) **චේතනාත්මකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම.**

### I පියවර

උක්ත චෝදනා වලින් එකක්වත් හෝ කිහිපයක් ඇතුලත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ජනාධිපතිවරයාට විරුද්ධව පෙත්සමක් සකස් කළ යුතු ය. එම පෙත්සම තුළ ජනාධිපතිට ඇති චෝදනා වේ හෝ චෝදනාවල සම්පූර්ණ විස්තර දක්වා තිබිය යුතු ය. එසේම ඒ පිළිබඳ පරීක්ෂාකර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිමක් ද තිබිය යුතු ය.

### II පියවර

එවැනි චෝදනා පත්‍රයක් පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතරයකින් සම්මත කොට කථා නායකවරයා වෙත භාරදිය යුතු ය. ඇතැම්විට පාර්ලිමේන්තුවේ 1/2 ක් සම්මත කළ චෝදනා පත්‍රයක් වුවද කථානායකවරයා වෙත ඉදිරිපත් කළ හැකිය. එවිට කථානායකවරයාට එම චෝදනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට වුවද හැකිය. එසේ නොමැතිනම් එම චෝදනා පත්‍රය භාරගැනීමට ද හැකිය. නමුත් 2/3 ක විශේෂ බහුතරයකින් සම්මත කොට චෝදනා පත්‍රය ඉදිරිපත් කළ විට එය ප්‍රතික්ෂේප කිරීමට කථානායක වරයාට නොහැකිය. ඔහු එය පාර්ලිමේන්තුව තුළ නැවත සම්මත කිරීම හා සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

### III පියවර

ජනාධිපතිවරයාට විරුද්ධව දෝශාභියෝග චෝදනා පත්‍රයක් කථානායකවරයාට ලැබුණු සැනින් ඔහු ඒ බව ජනාධිපතිවරයාට දැනුම් දිය යුතු වන්නේ ය. එවිට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අහිමි වන්නේ ය.

### IV පියවර

කථානායකවරයා නැවත එම චෝදනා පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එය සාකච්ඡා කොට නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව 2/3 කින් (විශේෂ බහුතරයකින්) එය නැවත සම්මත කළ යුතු වන්නේ ය.

## V පියවර

එසේ සම්මත කිරීමෙන් අනතුරුව කථානායකවරයා විසින් එම චෝදනා පත්‍රය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යථා පිරිදි පරීක්ෂණයක් පවත්වා ස්වකීය තීරණය හා ඊට අදාළ හේතු ද දක්වන වාර්තාවක් පාර්ලිමේන්තුවට සැපයිය යුතු වන්නේ ය. එම පරීක්ෂණයේ දී ජනාධිපති වරයාට පෞද්ගලිකව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් පෙනී සිට හේතු දැක්වීමට හැකි වන්නේ ය.

## V I පියවර

ජනාධිපතිවරයාට එල්ලවී ඇති චෝදනා වලට ජනාධිපති වරයා වැරදි කරුවන බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය බව පාර්ලිමේන්තුවට වාර්තාවක් මගින් දැක්වූ විට, එම ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තාව පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුලත්ව 2/3 ක විශේෂ බහුතරයකින් සම්මත කළ හොත් ජනාධිපති වරයා ධූරයෙන් ඉවත් විය යුතු වන්නේ ය.

මෙම ආකාරයට ජනාධිපතිවරයා ඉවත් කරනු ලබන දෝශාභියෝග චෝදනාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අපහසු තත්ත්වයක ස්ථාපනය කර තිබේ. සරලව දක්වන්නේ නම් ජනාධිපති වරයා ඉවත් කිරීමේ පිළිවෙත දැඩි අනම්‍ය ස්වභාවයක පවතී.

නිදර්ශන -: ශ්‍රී ලංකාව තුළ දෝශාභියෝග චෝදනාවක් එල්ල වන්නේ ආර්. ප්‍රේමදාස ජනාධිපති වරයාට පමණි. නමුත් එය ද සාර්ථක නොවීය.

## ජනාධිපති ධූරයේ පුරප්පාඩු පුරවන ආකාරය / අනුප්‍රාප්තිය

ජනාධිපතිවරයෙක් ස්වකීය වර්ෂ 6 ක ධූරකාලය ධරමින් සිටිය දී ජනපතිධූරයේ පුරප්පාඩු ඇතිවුවහොත් එම ඉතිරි ධූරකාලය සඳහා පත්වන ජනාධිපතිවරයා හඳුන්වනු ලබන්නේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා යනුවෙනි.

- ජනාධිපතිධූරයේ පුරප්පාඩු ඇතිවිය හැකි අවස්ථා කිහිපයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(I) උප වගන්තියේ සටහන් කර තිබේ.

(i) **ජනාධිපතිවරයා මිය යෑම.**
(ii) **කථානායකවරයා වෙත යවන ලිපියකින් ඉල්ලා අස්වීම.**
(iii) **ජනාධිපතිවරයාට පුරවැසි භාවය අහිමි වීම.**
(iv) **ජනාධිපති ලෙස තේරීපත් වූ පුද්ගලයා සති දෙකක් තුළ ජනපති ධූරයේ වැඩ භාර නොගැනීම හිතාමතා පැහැර හැරීම.**
(v) **දෝශාභියෝග චෝදනාවක් මගින් ධූරයෙන් ඉවත් කිරීම.**
(vi) **ජනාධිපති ධූරය දරමින් රජයේ නිලයක් දැරීම.**
(vii) **ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කළ විට.**

ජනාධිපතිධූරයේ පුරප්පාඩුවක් ඇති වූ සැනින් වැඩ බලන ජනාධිපතිවරයෙකු පත් කර ගැනීම සිදුවෙයි. ඒ අනුව වැඩ බලන ජනාධිපතිවරයා බවට පත් වන්නේ අගමැතිවරයාය. එම බලය ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී තිබේ. අගමැතිවරයා,අග්‍රවිනිශ්චකාරවරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චකාරවරයෙකු ඉදිරියේ දිවුරුම් දී වැඩබලන ජනාධිපති වරයා ලෙස වැඩබාර ගත යුත්තේ ය. අගමැතිවරයා නොමැති නම් කථානායකවරයා ද ඔහු ද ඊට නොපොහොසත් නම් අග්‍රවිනිශ්චකාරවරයාට ද වැඩ බලන ජනාධිපති වරයා ලෙස කටයුතු කළ හැකිය.

අගමැතිවරයා ⟶ කථානායක වරයා ⟶ අග්‍රවිනිශ්චකාරවරයා

වැඩ බලන ජනාධිපතිවරයා තෝරා ගැනීමෙන් අනතුරුව අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා පර්ලිමේන්තුව කැඳවනු ලබයි. පාර්ලිමේන්තුව කැඳවන එක් (1) මාසයක් අතුලත අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරාගත යුතු ය. යම් විටක ජනාධිපති ධූරය හිස් වන විට පාර්ලිමේන්තුව විසුරුවා තිබුණහොත් නව පාර්ලිමේන්තුවක් තෝරා ගෙන ඒ තුළින් මාසයක් ඇතුලත අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරාගත යුතු ය.

අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරාගනු ලබන්නේ පාර්ලිමේන්තුව තුළිනි. ඒ සඳහා ඒකාන්තර බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබාගත යුතු ය. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ රහස් ඡන්දයක් ඒ සඳහා පවත්වනු ලබයි. ප්‍රායෝගික තලය තුළ දී බොහෝ විට සිදු වන්නේ අගමැතිවරයාට අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස තේරීපත්වීමයි.

අනුප්‍රාප්තික ජනාධිපතිවරයාට ජනාධිපති ධූරයේ ඉතිරි නිල කාලය හිමි වේ. සෘජු මහජන ඡන්දයෙන් තේරීපත්වන ජනාධිපති වරයෙකු භුක්ති විඳින සියලු බලතල වරප්‍රසාද අනුප්‍රාප්තික ජනාධිපතිවරයාට ද හිමි වේ. අහිමි වන්නේ පූර්ණ නිලකාලය වන 6 වසරක ධූරය දැරීම පමණි.

**නිදර්ශන** -: 1993 මැයි 01 දා ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ඝාතනය විය. වැඩ බලන ජනාධිපතිවරයා ලෙස ඩී.බී. විජේතුංග දිවුරුම් දෙන ලදි. පසුව පාර්ලිමේන්තුව රැස් කරවා අනුප්‍රාප්තික ජනාධිපති වරයෙකු තෝරා පත් කර ගත්තේ ය. එම පාර්ලිමේන්තුව විජේතුංග මහතා අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කළේ ය. 1993 මැද භාගයේ සිට 1994 අගභාගය දක්වා ඔහු ප්‍රේමදාස මහතාගේ ඉතිරි නිල කාලයේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස කටයුතු කළේ ය.

## ● ජනාධිපති හා කැබිනට් මණ්ඩලය.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (1) ව්‍යවස්ථාවෙන් දැක්වන ආකාරයට ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා රාජ්‍යයේ විධායකයේ සහ ආණ්ඩුවේ නායකයා වන අතර සන්නද්ධ සේවාන්හි ප්‍රධාන අණදෙන නිළධාරියා වේ.

43(1) ව්‍යවස්ථාවට ජනරජයේ පාලනය මෙහෙයවීම සහ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍යය මණ්ඩලයක් වන්නේ ය. අමාත්‍යය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීම් හා උත්තර දීමට බැඳී සිටින්නේ ය.

43(2) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා අමාත්‍යය මණ්ඩලයේ සාමාජිකයෙකු වනවාක් මෙන්ම අමාත්‍යය මණ්ඩලයේ ප්‍රධානියා ද වන්නේ ය. ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය අතර සම්බන්ධතාව ගොඩ නැගෙන්නේ මෙම වගන්ති හරහා ය.

කැබිනට් මණ්ඩලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු කාර්යයභාරය පටන් ගැනෙන්නේ 43(3) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි අගමැති තනතුරට අයෙකු පත් කිරීමෙනි. පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇතැයි ජනාධිපතිවරයා කල්පනා කරන මන්ත්‍රීවරයා අගමැති තනතුරට පත්කළ යුතු ය.

කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද අමාත්‍යවරන්ට පවරනු ලබන විෂයයන් සහ කාර්යයන් ද තීරණය කරන්නේ ජනාධිපතිවරයා ය. එසේ තීරණය කළපසු අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් අමාත්‍යවරුන් පත් කිරීම කරනු ලබන්නේ ජනාධිපතිවරයා ය. මේ සඳහා අවශ්‍ය නම් අගමැතිවරයාගේ අදහස් විමසිය හැක.

අමාත්‍යය මණ්ඩලය පත් කිරීමේ දී තමන් වෙත රඳවාගත යුතු යැයි ජනාධිපතිවරයා කල්පනා කරන ඕනෑම අමාත්‍යාංශයක් මෙන්ම අමාත්‍යවරුන්ට පවරා නොදෙන ලද යම් විෂයයක් හෝ කාර්යයක් ජනාධිපතිවරයා යටතේ තබාගත හැක. මේ අනුව ජනාධිපතිවරයා යටතේ තබාගත හැකි අමාත්‍යාංශ සංඛ්‍යාව කොපමණ ද යන්න ගැන සීමාවක් නොමැති අතර එය ජනාධිපතිවරයාගේ අභිමතය අනුව තීරණය වේ. අමාත්‍යය මණ්ඩලයේ සංයුතිය මෙන්ම අමාත්‍යවරුන්ට අයත් විෂයයන් සහ කාර්යයන් තමන්ට අභිමත අයුරින් වෙනස් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වේ. මේ අනුව අගමැතිවරයා ඇතුළු ඕනෑම අමාත්‍යවරයෙකු තනතුරෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකිවන අතර එසේ වෙනස් කිරීම කැබිනට් මණ්ඩලයේ අඛණ්ඩතාව මෙන්ම කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුව වෙත දරණ වගකීමේ අඛණ්ඩතාවට ද බලපානු නොලැබේ. මෙසේ කරනු ලබන කිසිදු වෙනස් කිරීමක් ජනාධිපති තනතුරේ පැවැත්ම කෙරෙහි බලපානු නොලැබේ.

කැබිනට් මණ්ඩලයේ නායකයා වන්නේ ජනාධිපතිවරයා ය. ඒ අනුව කැබිනට් මණ්ඩලයේ ගස්වීම් කැඳවීම , මුලසුන දැරීම , කැබිනට් මණ්ඩල රැස්වීම් වල න්‍යාය පත්‍රය සකස් කිරීම ජනාධිපති විසින් සිදු කරයි. වැදගත් ප්‍රතිපත්තිමය කරුණක් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යම් ඇමතිවරයෙක් අදහස් කරන්නේ නම් එම කරුණු ප්‍රථමයෙන්ම ජනාධිපතිවරයා වෙත ඉදිරිපත්කොට ජනාධිපතිවරයාගේ අදහස් විමසිය යුතු ය.

ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ නායකයා වුවද කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකිව යුතු වුව ද ජනාධිපතිවරයා එම අවශ්‍යතාවයෙන් බැඳී නොමැත. එමෙන්ම අමාත්‍යවරුන්ට එරෙහිව අධිකරණය ඉදිරියට යා හැකි වුවද ජනාධිපතිවරයාට එරෙහිව එසේ කළ නොහැක. අනෙක් අතට ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත්කරන විශ්වාසභංග යෝජනාවක් සම්මත වීමෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ අයවැය ලේඛනය පාර්ලිමේන්තුව තුළ පාරාජය වීමෙන් කැබිනට් මණ්ඩලය විසිරී ගිය ද එම තත්ත්වය ජනාධිපතිගේ ධූරය හා පැවැත්ම කෙරෙහි බලපානු නොලැබේ.

කැබිනට් මණ්ඩලයේ සංයුතිය තීරණය කිරීම, අමාත්‍යවරුන් පත් කිරීම, ඔවුන්ට විෂය කරුණු පවරා දීම සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම යන සෑම දෙයක්ම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා අසහාය බලයක් භුක්ති විඳින බවයි.

● ජනාධිපති සහ ව්‍යවස්ථාදායකය.

42 ව්‍යවස්ථාව - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද මහජන ආරක්‍ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බල පවත්නා නීතිය ඇතුළු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල , කාර්යයන් හා කර්තව්‍යය යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.

මෙම විධානය ප්‍රායෝගික වටිනාකමක් ඇති දෙයක් ලෙස සැලකිය නොහැක. හේතුව ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෙකු නොවීමත් , වගකීම් කඩකරන විට ඒ ගැන ප්‍රශ්න කරමින් වගකීම ක්‍රියාත්මක කරවාලීමට ව්‍යවස්ථාදායකයට ඇති බලය සීමාවීමත් ය. ජනාධිපතිවරයාගේ ක්‍රියාවන් පාර්ලිමේන්තුවට ප්‍රශ්න කළ හැකි වුව ද එසේ කළ හැක්කේ කථානායකවරයාගේ අවසරය මත ඉදිරිපත් කරන විශේෂ යෝජනාවකට අනුවය. පාර්ලිමේන්තුවට ඔහුව ඉවත්කළ හැකි වන්නේ දෝෂාභියෝගයක් යටතේ පමණි. එය අතිශයින්ම අපහසු හා සංකීර්ණ ක්‍රියාවලියක් වේ. එබැවින් 42 වන ව්‍යවස්ථාව හුදෙක් නාමික දෙයක් පමණක් වන අතර එය වටිනාකමක් නොමැති ව්‍යවස්ථාමය සැරසිල්ලක් පමණක් වේ.

65(1) ව්‍යවස්ථාව - මෙම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ව්‍යවස්ථාවේ 41(ඇ) ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේ ය. 41(ඇ) ව්‍යවස්ථාවට අනුව මහ ලේකම් තනතුරට පත් කළ යුතු තැනැත්තා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්දේශ කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් එම නිර්දේශ අනුමත කළහොත් පමණක් ජනාධිපතිවරයා විසින් පත් වීම කළ යුතු ය.

6561) ව්‍යවස්ථාව - මෙම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා නිල කාලයට ප්‍රථමයෙන් ධූරයෙන් ඉවත් කිරීමේ බලය ජනාධිපති සතු වේ. නමුත් එම බලය ක්‍රියාවට නැංවිය යුත්තේ,

(අ) 65(5) (ඈ) ව්‍යවස්ථාට අනුව මහ ලේකම්වරයා රෝගාතුර වීම නිසා හෝ ශාරීරික හෝ මානසික දුර්වලතාවකට පත්වූ විට,

(ආ) 65(5) (ඉ) ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසින් මහ ලේකම්වරයාට විරුද්ධව සම්මත කොට ඉදිරිපත් කරන යෝජනවාක් අනුව,

65(6) ව්‍යවස්ථාව - මෙම ව්‍යවස්ථාවට අනුව මහ ලේකම්වරයා සිය ධූරයේ කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වූ විට මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට 41 (ඇ) ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව තැනැත්තෙකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

70 ව්‍යවස්ථාව - මෙම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය කැඳවීම , කල් තැබීම හා විසුරුවා හැරීම ජනාධිපතිවරයා විසින් කළ යුතු ය.

(අ) කල්තැබීම - 70(2) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා නිකුත් කරන ප්‍රකාශනයේ පාර්ලිමේන්තුව යළි කැඳවන දිනය සඳහන් කළ යුතු ය. එම දිනය ප්‍රකාශය නිකුත් කළ දිනයේ සිට මාස දෙකක් නොඉක්ම විය යුතු ය.

(ආ) විසුරුවා හැරීම - ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේ 70 ව්‍යවස්ථාවේ a , b , c සහ d යන අතුරු ව්‍යවස්ථාවන්හි දැක්වෙන විධිවිධාන වලට යටත්ව ය.

70 a ව්‍යවස්ථාව - මහ මැතිවරණයකින් පසුව අලුතින් තේරී පත් වූ පාර්ලිමේන්තුවක් සමඟින් සම්මත කරන යෝජනාවක් මගින් ඉල්ලා සිටිය හොත් මිස තේරීපත් වූ දින සිට වසරක් යන තෙක් විසුරුවා නොහැරිය යුත්තේ ය.

70 b ව්‍යවස්ථාව - මහ මැතිවරණයකින් පසුව පාර්ලිමේන්තුව රැස්වෙන ප්‍රථම සැසිවාරයේ දී ඉදිරිපත්කරන ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂප කළ ද , ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුතු ය.

70 d ව්‍යවස්ථාව - වාර්ෂික අයවැය ලේඛනය පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂ්ප කළ විට හා දෙවන වරට ද එය ප්‍රතික්ෂේප කළ හොත් 70 වන ව්‍යවස්ථාව නොසලකා පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක.

33 (අ) ව්‍යවස්ථාව - ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

33 (අ) ව්‍යවස්ථාව - පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම් වල මුලසුන දැරීම මෙම විධිවිධාන වලට අමතරව ජනාධිපතිවරයා සමඟ සම්බන්ධතා පවත්වන්නේ කැබිනට් මණ්ඩලය හරහා ය. කැබිනට් මණ්ඩලය ජනාධිපති සහ පාර්ලිමේන්තුව එකට යාකරන පුරුක වේ. අනික් අතින් පාර්ලිමේන්තුවට ජනාධිපති කෙරෙහි ඇති එකම බලය වන්නේ ජනාධිපතිට එරෙහිව දෝෂාභියෝගට ඉදිරිපත් කිරීම පමණි. නමුත් එය කිසිසේත්ම පහසු කාර්යයක් නොවේ. ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර ඇති මෙම සම්බන්ධතා රටාව දෙස බලන විට පෙනී යන්නේ විධායක බලතල සහ කැබිනට් මණ්ඩලය හරහා ද බහුතර බලයක් තිබේ නම් තම පක්ෂය හරහා ද සහ තම තමන්ට අභිමත අයුරින් පාර්ලිමේන්තුව පාලනය කිරීමට හැකි බවය. නමුත් ව්‍යවස්ථාදායකයට ජනාධිපතිවරයා කෙරෙහි බලපෑම බෙහෙවින් පහළ මට්ටමක පවතී.

## ● ජනාධිපති සහ අධිකරණය.

1978 අංක 02 දරණ අධිකරණ විධිවිධාන පනත මගින් පහත සඳහන් අධිකරණ ආයතන පද්ධතිය හඳුන්වාදෙන ලදි.

1. ශ්‍රේෂ්ඨාධිකරණය.
2. අභියාචනාධිකරණය
3. මහාධිකරණය
4. දිස්ත්‍රික් උසාවි
5. මහේස්ත්‍රාත් උසාවි
6. ප්‍රාථමික උසාවි

මෙයින් පළමු උසාවි තුන ඉහළ උසාවි වශයෙනුත් අනෙක් උසාවි පහළ උසාවි වශයෙනුත් හඳුන්වා දෙන ලදි.

1978 මුල් ව්‍යවස්ථාව මගින් 1972 විධායකයටත් වඩා වැඩි බලතල ප්‍රමාණයක් අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජනාධිපතිට පවරා දෙනු ලැබුව ද 17 වන ව්‍යවස්ථා සංශෝදනය මගින් පිහිටවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් එම විධායකය සතු වූ බලතල යම්තාක් දුරට සංවරණය කිරීමට උත්සාහ ගෙන ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චකාරවරුන් පත් කිරීමේ බලය මෙම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට පවරා තිබුණි.

107 (1) අග්‍ර විනිශ්චකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චකාරවරයෙක් ද 41 (ඇ) ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයක් මගින් පත්කරනු ලබන්නාහ.

17 වන ව්‍යවස්ථා සංශෝදනය මගින් එකතු කළ 41 (ඇ) ව්‍යවස්ථාව යටතේ දක්වා තිබුණේ. ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයන් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මෙම ව්‍යවස්ථාවේ උප ලේඛනයේ සඳහන් කිසිම ධූරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකු පත්කරනු නොලැබිය යුත්තේ ය. යනුවෙනි. මෙමගින් උත්සාහ කර තිබුණේ ජනාධිපතිවරයාගේ පත් කිරීමේ බලතල සංවරණය කිරීමයි.

(අ) මීට අමතරව 41 (ඇ) ව්‍යවස්ථාව මගින්,

ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන නිර්දේශ මත සහ එම නිර්දේශ සඳහා ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලැබුණු පසුව අධිකරණයට අදාළ පහත දැක්වෙන පත්කිරීම් ජනාධිපතිවරයාට කළ හැකි වන්නේ ය.

1. අග්‍රවිනිශ්චකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන්
2. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන්
3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයින්
4. නීතිපතිවරයා.

(ආ) 107 (4) ව්‍යවස්ථාව - අග්‍රවිනිශ්චකරු හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකරුවන් සහ අභියාචනාධිකරණයේ සභාපති හා විනිශ්චයකරුවන් තම ධූරයේ වැඩ භාරගත යුත්තේ ජනාධිපති ඉදිරියේ කරන දියුරුම් දීමෙන් අනතුරුවය.

(ඇ) 109 (1) ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ අභියාචණාධිකරණයේ විනිශ්චකරුවෙකු පාර්ලිමේන්තුවේ නොපැමිණි සාමාජිකයින් ද ඇතුළුව 1/2 ක අනුමැතිය සහිතව සම්මත කරන යෝජනාවක් පරිදි තනතුරෙන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වේ.

(ඈ) 109 (1) ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ තාවකාලිකව ඇතිවන ඇබෑර්තු සඳහා 42 (ඇ) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි වැඩ බැලීමේ පදනම මත විනිශ්චකාරවරු පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වේ.

(ඉ) 110 (1) ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චකාරවරයෙකුට වෙනත් ලිඛිත නීතියක් යටතේ වෙනත් කාර්යයන් කිසිවක් ඉටු කිරීමට නියම කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වේ.

(ඊ) 110 (3) ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ ස්ථිර සේවයේ යෙදී සිටි විනිශ්චයකාරවරයෙකුට විශ්‍රාම ගැනීමෙන් පසුව ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්තක් නොමැතිව අධිකරණ කටයුතු වල යෙදීම තහනම් වන්නේ ය.

(උ) 111(2) (අ) ව්‍යවස්ථාව - අධිකරණ සේවා කොමිෂමේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මහාධිකරණ විනිශ්චකරුවන් පත්කළ යුත්තේ ය. 112 (අ) ව්‍යවස්ථාව - අධිකරණ සේවා කොමිෂමේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් මහාධිකරණ විනිශ්චකරුවන් තනතුරෙන් ඉවත් කළ හැක. එමෙන්ම ඔවුන් ජනාධිපතිවරයාගේ විෂය පාලනයට යටත් වේ.

(ඌ) 34 (1) ව්‍යවස්ථාව - වරද කරුවන්ට සමාව දීමේ බලය ජනාධිපති සතු වේ. ඒ අනුව,

1. සම්පූර්ණ සමාවක් හෝ නිත්‍යානුකුල කොන්දේසි සහිත සමාවක් දීම.
2. නියම කරන ලද දඬුවම ක්‍රියාත්මක වීම දින නියමයක් නොමැතිව හෝ ඇතිව කල් දැමීම.
3. නියම කරන ලද දඬුවම වෙනුවට ලිහිල් දඬුවමක් නියම කිරීම.
4. නියම කරන ලද දඬුවම මුළුමනින්ම අහෝසි කිරීම , අර්ධ වශයෙන් අඩු කිරිම , දඩ මුදලක් මුළුමනින්ම නිෂ්ප්‍රභා කිරීම හෝ අඩු කිරීම , රාජ සන්තක කරන ලද වස්තුවක් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් අත්හිටුවීම.

(එ) 129 (1) ව්‍යවස්ථාව - ජනාධිපතිවරයාට ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබා ගැනීමේ බලය.

ඉහත දැක්වූ විධිවිධාන ලෙස බැලීමේ දී පෙනී යන්නේ පත් කිරීම් , ඉවත් කිරීම් හා සමාව දීම් යන කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට යම් යම් අධිකරණ බලතල හිමි වී තිබෙන බවය. නමුත් එම බලතල ක්‍රියාවට නැංවීමේ දී අධිකරණයට බලපෑම් කළ හැකි ප්‍රමාණය බෙහෙවින් සීමා වන්නේ ය.

## ● ජනාධිපති හා රාජ්‍ය සේවය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (1) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා විධායකයේ නායකයා වන්නේ ය. මේ අනුව සමස්ත රාජ්‍යය සේවය පාලනය කිරීමේ තනි බලය ජනාධිපතිවරයා සතු වේ. රාජ්‍යය සේවාව පාලනය කිරීමේ දී ජනාධිපති සත- බලතල ක්‍රියාවට නැංවෙන ක්‍රම කිහිපයක් දැකිය හැක.

අ. ජනාධිපතිවරයාගේ තනි අභිමතය අනුව රාජ්‍යය වේවයේ කළ හැකි පත් කිරීම් උසස් රාජ්‍යය නිලධාරීන් මෙම ගණයට අයත් වේ.

ආ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ඒකාබද්ධ සිදු කළ යුතු පත් කිරීම් -:

මෙය දෙයාකාර ස්වරූපයක් ගනී.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත කළයුතු පත් කිරීම්.
   මෙයට පහත දැක්වෙන පත්කිරීම් අයත් වේ.

   (i) මැතිවරණ කොමිෂන් සභාව
   (ii) රාජ්‍යය සේවා කොමිෂන් සභාව
   (iii) ජාතික පොලිස් කොමිෂන් සභාව
   (iv) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
   (v) අල්ලස් හෝ දූෂන චෝදනා විමර්ශනය කිරීමේ නිත්‍යය කොමිෂන් සභාව.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් කළ යුතු පත් කිරීම්. මෙයට පහත දැක්වෙන පත් කිරීම් අයත් වේ.

   (i) නීතිපතිවරයා
   (ii) විගණකාධිපතිවරයා
   (iii) පොලිස්පතිවරයා
   (iv) ඔම්බුඩ්ස්මන්වරයා
   (v) පාර්ලිමේන්තු මහලේකම්වරයා

3. ජනාධිපතිවරයා හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

   රාජ්‍යය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් නව දෙනා සහ ඔවුන් අතුරින් එක් අයෙකු සභාපති ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්දේශය පරිදි කොමිසමේ සාමාජිකයින් ඉවත් කිරීමේ බලය ද ජනාධිපතිවරයා සතු වේ. එමෙන්ම කොමිසමේ සාමාජිකයින් මාස දෙකකට නොවැඩි කාලයක් සඳහා නිවාඩු අනුමත කිරීම සහ එම කාලය සඳහා වෙනත් අයෙකු පත් කිරීමේ බලය ද ජනාධිපති සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (3) ව්‍යවස්ථාවේ සඳහන් වන ආකාරට සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම , උසස් කිරීම , ස්ථාන මාරු කිරීම , විනය පාලනය කිරීමය සහ සේවයෙන් පහ කිරීම, අමාත්‍යය මණ්ඩලය සතු වන අතර අමාත්‍යය මණ්ඩලය විසින් ඒ බලතල කොමිෂන් සභාවේ අදහස් විමසා දැනගැනීමෙන් පසුව ක්‍රියාවේ යෙදිය යුත්තේ ය.

ඉහත සඳහන් ව්‍යවස්ථා දෙක සමඟ ජනාධිපතිවරයා සලකා බැලීමේ දී කිව හැක්කේ ජනාධිපතිවරයා අමාත්‍යය මණ්ඩලයේ සාමාජිකයෙකු වනවා මෙන්ම එහි නායකයා ද වන බවයි. ප්‍රායෝගික ක්ෂේත්‍රය තුළ දැකිය හැක්කේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම ජනාධිපතිවරයාගේ තනි අභිමතය පරිදි සිදුවන බවය. අනෙකුත් කරුණු කිසිවක් ජනාධිපතිවරයාගේ අනුදැනුමෙන් හා අනුමැතියෙන් තොරව සිදු නොවේ. මේ අනුව පෙනී යන්නේ රාජ්‍යය සේවය පාලනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා අසහාය බලයක් භුක්ති විඳින බවය. වර්තමානයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අකර්මන්‍යයව පැවතීම සහ එම හේතුවෙන් රාජ්‍යය සේවයේ සමහර පත් කිරීම් ජනාධිපතිවරයාගේ අභිමතය අනුවම කිරීම නිදසුන් ලෙස දැක්විය හැක.

# අගමැතිවරයා.

හැඳින්වීම.

කවුද?

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මගින් **මිශ්‍ර ආණ්ඩුක්‍රමයක්** ස්ථාපනය කළේ ය. ඇතැම් විචාරකයින් **දෙමුහුන් ආණ්ඩුක්‍රමයක්** ලෙස ද එය හඳුන්වයි. විධායකය නිර්මාණය වී තිබෙන්නේ ජනාධිපති වරයා + අගමැතිවරයා + අමාත්‍යය මණ්ඩලය යන කොටස්වල එකුවෙනි. අමාත්‍යය මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ ජනාධිපතිවරයා ය. කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක නම් අමාත්‍යය මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ අගමැතිවරයා ය. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් නොවේ. ඒ අනුව අගමැතිවරයා යනු අමාත්‍යය මණ්ඩලයේ සාමාජිකයෙකු පමණි.

පත්කිරීම

අගමැතිවරයා පත් කරනු ලබන්නේ රාජ්‍යය නායකයා වන ජනාධිපතිවරයා විසිනි. පාර්ලිමේන්තුවේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගෙන ඇති මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අගමැති ධූරයට පත් කරයි.

43 (3) වගන්තිය.

**"පාර්ලිමේන්තුවේ යම් කිසි මන්ත්‍රීවරයෙකු කෙරෙහි පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිමයෙන් ඇතැයි ජනාධිපති වරයා කල්පනා කරේ ද ජනාධිපතිවරයා විසින් එම මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍යය ධූරයට පත් කළ යුත්තේ ය."**

**(N.B)** *ජනාධිපතිවරයාගේ පක්ෂය පාර්ලිමේන්තුවේ බලය දිනාගෙන ඇති විට තමන් පක්ෂයේ නායකයා බැවින් මීළග නායකයා අගමැතිවරයා ලෙස පත් කිරීමට ජනාධිපති වරයාට හැකිය. නමුත් ජනාධිපතිට අවශ්‍ය නම් පසු පෙළ නායකයෙක් වුවද අගමැතිවරයා ලෙස තෝරා පත් කළ හැකිය. තමා පක්ෂයේ නායකයා බැවින් අනෙකුත් පක්ෂ සාමාජිකයින් විනයානුකූල බැඳීම යටතේ එම පත් කිරීමට විරුද්ධ නොවේ.*

**නිදර්ශන -:** 1989 ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා විසින් ගාමිණී දිසානායක , ලලිත් ඇතුලත් මුදලි වැනි ශ්‍රේෂ්ඨ නායකයන් නොසලකා හරමින් ඩී.බී. විජේතුංග මහතා අගමැති ලෙස තෝරාපත් කිරීම.

**(N.B)** *නමුත් , ජනාධිපතිවරයාගේ විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තුවක් පවතින විට එම පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස පත් කිරීමට ජනාධිපතිවරයාට සිදු වේ. එවිට ආණ්ඩුව තුළ පවතින්නේ සහභාගි තත්ත්වයකි.*

**නිදර්ශන -:** 2001 - 2004 කාලය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ අගමැති ධූරයට තෝරාපත් කිරීමට සිදු වීම.

නිලකාලය

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය තුළ ස්ථාපනය කළ අගමැතිවරයාගේ නිල කාලය වසර 6 කි. නමුත් නිල කාලය අවසන් වීමට පෙර අගමැතිවරයාගේ ධූරයෙහි පුරප්පාඩු ඇතිවිය හැකිය.

පුරප්පාඩු ඇති විය හැකි අවස්ථා

අගමැති ධූරයේ පුරප්පාඩු ඇතිවිය හැකි අවස්ථා කිහිපයක් හඳුනාගත හැකිවේ.

(i) **ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා ඉවත් කිරීම.**
(ii) **අගමැතිවරයා ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම.**
(iii) **පාර්ලිමේන්තුවේ මන්ත්‍රීධූරය අහිමි වීම.**
(iv) **විශ්වාසභංග යෝජනාවක් ව්‍යවස්ථාදායකය තුළ සම්මත වීම.**
(v) **අගමැතිවරයා ජනාධිපතිවරයා ලෙස තේරී පත් වීම.**
(vi) **ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරජයට පත් වීම.**
(vii) **අගමැතිවරයා මිය යාම.**

මෙම කුමන හෝ ආකාරයකින් අගමැති ධූරයේ ඇතිවන පුරප්පාඩු සඳහා නව අගමැතිවරයෙකු තෝරාපත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

ඉවත් කිරීම

අගමැතිවරයා නිලකාලය වසර 6 සම්පූර්ණ වීමට පෙර ධූරයෙන් ඉවත්කළ හැකිය.

- **ජනාධිපතිවරයා ස්වකීය අත්සනින් යවන ලිපියක් මගින් අගමැතිවරයා ඉවත් කළ හැකිය.**

- **පාර්ලිමේන්තුව තුළ සම්මත කරනු ලබන විශ්වාස භංග යෝජනාවක් මගින් අගමැතිවරයා ඉවත් කළ හැකිය.**

අගමැතිවරු

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාව තුළ අගමැතිධූරය හෙබවූ අගමැතිවරු, ආර්. ප්‍රේමදාස , ඩී.බී. විජේතුංග , චන්ද්‍රිකා බණ්ඩාරණායක , රනිල් වික්‍රමසිංහ , මහින්ද රාජපක්ෂ , දි.මු ජයරත්න. ලංකාවේ ජනාධිපතිවරුන් බවට පත් වූ සියලු දෙනා අගමැතිවරු ලෙස කටයුතු කළ අය වීම විශේෂත්වයකි.

## ■ අගමැතිවරයාගේ කාර්ය හා බලතල.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මිශ්‍ර ආණ්ඩුක්‍රමයකි. රාජ්‍ය නායකයා , විධායකයේ නායකයා , ආණ්ඩුවේ නායකයා , සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වන්නේ ජනාධිපතිවරයා ය. **එම නිසා කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක මෙන් බලවත් අගමැතිධූරයක් හා අගමැතිවරයාට ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ අංශ තුළ විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් මෙම ආණ්ඩුක්‍රමය තුළ හිමි නොවේ.** අගමැතිවරයා කාර්ය බලතල අතින් මෙන්ම තත්ත්වය අතින් ද සීමා සහිත භූමිකාවක් රඟ දක්වයි.

(i) **මාසයක් පමණ කාලයකට වැඩ බලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමි කර දී තිබුණේ එක් කාර්ය හා බලතලයක් පමණි. ඒ ජනාධිපති ධූරයේ පුරප්පාඩු ඇතිවුවහොත් ජනාධිපති ධූරයේ වැඩ බැලීමයි. ව්‍යවස්ථාවේ දක්වා ඇත්තේ මාසයක් තුළ අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පාර්ලිමේන්තුව තුලින් තෝරාගන්නා තෙක් මසක් පමණ වැඩ බලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීමට අගමැතිවරයාට හැකිවන බවයි.

**නමුත්,**

ජනාධිපතිධූරය පුරප්පාඩුව ඇතිවන විට පාර්ලිමේන්තුව විසිරී ඇත්නම් **එක් මාසයක්** යන කාලසීමාව වෙනස් විය හැකිය. එහි දී සිදු වන්නේ මහ මැතිවරණයක් පවත්වා නව පාර්ලිමේන්තුවක් තෝරාගෙන ඒ තුළින් මාසයක් ඇතුලත අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරාපත් කරගන්නා තෙක් අගමැති ධූරයේ වැඩ බැලිය යුතු ය. එවැනි තත්ත්වයක දී **'එක් මාසයකට'** වඩා වැඩි කාලයක් වැඩ බලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීමට අගමැතිවරයාට හැකිය.

(ii) **අනෙකුත් බලතල හා කාර්යයන් අගමැතිවරයාට හිමි වන්නේ ජනාධිපති වරයා විසින් හිමිකර දෙන්නේ නම් පමණි.**

නිදර්ශන -: අමාත්‍යය මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම , මාරු කිරීම , ඉවත් කිරීම, විෂයන් තීරණය කිරීම වැනි කාර්යයන් වල දී ජනාධිපතිවරයාට අවශ්‍ය නම් අගමැතිවරයාගේ අදහස් විමසිය හැකිය. එවැනි විටක අගමැතිවරයා ඒ සම්බන්ධයෙක් අදහස් ඉදිරිපත් කළ හැකිය. නමුත් ජනාධිපති වරයාට එම අදහස් පිළිගැනීමට බැඳී නොමැත. නමුත් විරුද්ධ පක්ෂයක අගමැතිවරයෙකු සමඟ කටයුතු කරන විට අගමැතිවරයාගේ උපදෙස් නොසලකා හැරීමට ජනාධිපතිවරයාට නොහැකි ය.

නිදර්ශන -: අමාත්‍යය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව , අමාත්‍යාංශ සංඛ්‍යාව ජනාධිපතිවරයා තීරණය කරයි. ජනාධිපතිට අවශ්‍ය නම් අගමැතිවරයාගේ අදහස් විමසිය හැකිය. එවැනි අවස්ථාවක අගමැතිවරයාට තමන්ගේ අදහස් ඉදිරිපත් කළ හැකිය. නමුත් එම අදහස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත. නමුත් විරුද්ධ පක්ෂයේ අගමැතිවරයෙකු සමඟ කටයුතු කරන්නේ නම් අගමැතිගේ අදහස්වලට සවන් දීමට ජනාධිපති වරයාට සිදු වේ.

නිදර්ශන -: අගමැතිවරයාට ලබාදෙන අමාත්‍යාංශ සංඛ්‍යාව සහ ඒ කුමන අමාත්‍යාංශයද යන්න පවා තීරණය කරනු ලබන්නේ ජනාධිපතිවරයා ය. ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට බලපෑම් කිරීමට අගමැතිවරයාට නොහැකිය. නමුත් විරුද්ධ පක්ෂයක අගමැතිවරයෙකු නම් මෙම තත්ත්වය වෙනස් වේ.

නිදර්ශන -: නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීමේ දී අමාත්‍යාංශ ලේකම් වරුන් පත් කිරීමේ දී ද ජනාධිපතිවරයාට අගමැතිගේ අදහස් විමසිය හැකි ය. එවැනි අවස්ථාවක අගමැතිවරයාට ස්වකීය අදහස් ඉදිරිපත් කළ හැකිය. නමුත් එම අදහස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නැත. නමුත් විරුද්ධ පාක්ෂික අගමැතිවරයෙකු සමඟ කටයුතු කරන විට ඔහුගේ අදහස් වලට සවන්දිය යුතු ය.

**(N.B)** නමුත් ආණ්ඩුව තුළ සහ හැසිරීමක් ක්‍රියාත්මක වන විට ජනාධිපතිවරයාගේ බලතල සීමා වී ඊට සාපේක්ෂව අගමැතිවරයාගේ බලතල වර්ධනය වන ආකාරය හඳුනාගෙන හැකිය.

නිදර්ශන -: ලංකාවේ 2001 - 2004 අතර පැවති ආණ්ඩුකරණය තුළ එවැනි තත්ත්වයක් පැවතුනි.

- **කෙසේ වෙතත් 1978 දෙවන ජන රජ ආණ්ඩුක්‍රමය තුළ අගමැතිවරයාගේ තත්ත්වය අඩු වැදගත් කමක් ලබාදිය නොහැකිය.**

ඊට අදාළ හේතු,

1. **ආණ්ඩුවේ දෙවෙනියා ලෙස කටයුතු කිරීම.**
2. **රටේ දෙවෙනි පුරවැසියා වන්නේ අගමැතිවරයා ය. ඔහු දෙවැනි වන්නේ ජනාධිපතිවරයාට පමණි.**
3. **ජනාධිපතිධූරය හිස් වුවහොත් වැඩබලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කරන්නේ අගමැතිවරයා ය.**
4. **වැඩබලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීම අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස පත්වීමට අදාළ මාර්ගය තනා ගැනීමට ලැබෙන පිටුවහලක් වීම.**
5. **අගමැතිවරයා ලෙස පත්වීම මීළඟ ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීමට අදාළ තත්ත්වය නිර්මාණය කරන්නක් වීම. ලංකාවේ විධායක ජනාධිපති ධූරය දැරූ සෑම අයෙක්ම අගමැති ධූරයේ කටයුතු කර තිබේ.**
6. **සහ හැසිරීම් තත්ත්වයක දී ප්‍රායෝගික තත්ත්වය තුළ අගමැතිවරයා විශාල වශයෙන් බලවත් කටයුතු කිරීම.**

# කැ බිනට් මණ්ඩලය

හැඳින්වීම මොකක් ද

1978 ආණ්ඩුක්‍රමය මිශ්‍ර ආණ්ඩුක්‍රමයකි. එම නිසා විධායකය නිර්මාණය වන්නේ **ජනාධිපතිවරයා , අගමැතිවරයා සහ අමාත්‍යයවරුන්ගෙනි.** ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වේ. කැබිනට් මණ්ඩලය නිර්මාණය වන්නේ අගමැති සහ කැබිනට් අමාත්‍යයවරුන්ගෙනි. **කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව අගමැතිවරයාගේ හා කැබිනට් අමාත්‍යවරුන්ගේ බලතල හා කාර්යයන් ප්‍රමාණය මෙම ආණ්ඩුක්‍රමය තුළ සීමා වී තිබේ.**

සංයුතිය

**කැබිනට් මණ්ඩලයේ සංයුතිය ජනාධිපති + අගමැති + කැබිනට් අමාත්‍යවරුන්.** ජනතාව විසින් සෘජු ඡන්දයෙන් ජනාධිපතිවරණයක දී කැබිනට් , මණ්ඩලයේ නායකයා වන ජනාධිපති වරයා තෝරාපත් කරයි. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව තුලින් කැබිනට් මණ්ඩලය තෝරා පත් කරයි. පාර්ලිමේන්තුවේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගෙන ඇති පුද්ගලයා අගමැතිවරයා ලෙස පත්කරනු ලබයි. පසුව පාර්ලිමේන්තුව තුළින් අමාත්‍යවරු නියෝජ්‍ය අමාත්‍යවරු තෝරාපත් කරයි. එහි දී අගමැතිවරයාගේ උපදෙස් විමසීමට ජනාධිපතිවරයාට හැකිය. නමුත් එම උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත.

කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් ප්‍රමාණය ඒ ඒ අමාත්‍යයවරුන්ට ලබාදෙන අමාත්‍යාංශ හා නියෝජ්‍යය අමාත්‍යවරුන් හා ලේකම්වරුන් ආදී සියල්ල තීරණය කරනු ලබන්නේ ජනාධිපතිවරයා ය. කැබිනට් අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ මාරු කිරීම, එම ධුරවලින් ඉවත් කිරීම ද තීරණය කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වන්නේය. ජනාධිපතිවරයාට තමා යටතේ කැමති අමාත්‍යාංශ ප්‍රමාණයක් තබා ගත හැකිවන්නේ ය. **මෙම ආකාරයට කැබිනට් මණ්ඩලය නිර්මාණය කිරීමේ කේන්ද්‍රිය සර්වබලධාරී නිර්මාපකයා රාජ්‍ය නායක ජනාධිපතිවරයා වන්නේ ය.**

කැබිනට් මණ්ඩලය තෝරාපත් කිරීමේ දී වාර්ගික ආගමික - ප්‍රාදේශීය හා කුල පදනම සම්බන්ධයෙන් ද ජනාධිපතිවරයා අවධානය යොමු කරනු ලබන්නේ ය. ඊට හේතු වන්නේ,

- **ලංකාව තුළ සහාග ආණ්ඩු නිර්මාණය වීම.**
- **බහු සංස්කෘතික පදනමක් සහිත සමාජයක් පැවතීම.**

**නිදර්ශන -: 2010 - 2016 කැබිනට් මණ්ඩලයේ අමාත්‍යය ධූර කිහිපයක්.**

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යය - ආරක්ෂක අමාත්‍යය | - | ............................................ |
| අධ්‍යාපන අමාත්‍යය | - | ............................................ |
| සෞඛ්‍යය අමාත්‍යය | - | ............................................ |
| විදේශ අමාත්‍යය | - | ............................................ |
| අධිකරණ අමාත්‍යය | - | ............................................ |
| වතුකම්කරු අමාත්‍යය | - | ............................................ |

නිල කාලය

කැබිනට් මණ්ඩලයේ නිල කාලය වසර 06 කි.

ඉවත් කිරීම.

කැබිනට් මණ්ඩලයේ නිල කාලය වසර 06 කි. නමුත් පාර්ලිමේන්තුව තුළ සම්මත කරනු ලබන විශ්වාසභංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය නිලකාලය පෙර ඉවත් කළ හැකිය.

තවදුරටත්,

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුව තුළ පරාජයට පත් වීම.
අයවැය ලේඛණය පාර්ලිමේන්තුව සම්මත නොකිරීම.

වැනි හේතු මත ද කැබිනට් මණ්ඩලය නිලකාලයට පෙර ඉවත් වන්නේ ය. <u>නමුත් විශ්වාස භංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලයේ නායකයා වන ජනාධිපතිවරයා ඉවත් කිරීමට පාර්ලිමේන්තුවට බලය නොමැත්තේ ය</u>.

■ <u>කැබිනට් මණ්ඩලයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

1. **ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම.**

කැබිනට් මණ්ඩලය ප්‍රතිපත්ති සාකච්ඡා කරන සහ ඒවා තීරණය කරන සභාවයි. දේශීය හා විදේශීය වශයෙන් වැදගත් සෑම ප්‍රතිපත්තියක්ම මෙහි දී සාකච්ඡාවට ලක් කරයි. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීමට අදාළව සිදු කරන වැදගත් කාර්යන් තුනකි.

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීම.
- අයවැය ලේඛනය සකස් කිරීම.
- ව්‍යවස්ථාදායකය සකස් කරන නීති පවා මූලිකව තීරණය කිරීම.

2. **නීති ක්‍රියාත්මක කිරීම.**

කැබිනට් මණ්ඩලය නීති ක්‍රියාත්මක කරයි. ව්‍යවස්ථාදායකය විසින් සම්පාදිත නීති ක්‍රියාත්මක කරන්නේ කැබිනට් මණ්ඩලය විසින්. වෙනත් ලෙසකට දක්වන්නේ නම් කැබිනට් මණ්ඩලය මූලිකව තීරණය කර ව්‍යවස්ථාදායකය ලවා සම්පාදනය කරවා ගත් නීති කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි.

3. **පරිපාලන කටයුතු විධිමත් කිරීම.**

රාජ්‍යයේ කටයුතු විවිධ දෙපාර්තමේන්තු - අමාත්‍යාංශ වලට බෙදා දක්වමින් එම දෙපාර්තමේන්තු අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම, එම දෙපාර්තමේන්තු අතර ඇතිවන ගැටුම් කළමණාකරණය කරමින් පරිපාලන කටයුතු විධිමත් කිරීම කැබිනට් මණ්ඩලයේ කාර්යයකි.

තවදුරටත්,

4. **මුදල් තීරණය කිරීම.**

කුමන ආකාරයේ බදු පැනවිය යුතු ද එම බදු කෙසේ අයකර ගත යුතු ද එම මුදල් කෙසේ වැය කළ යුතු ද යන්න කැබිනට් මණ්ඩලය තීරණය කරයි. බදු පැනවීම - බදු අහෝසි කිරීම - බදු සංශෝධනය ආදිය තීරණය කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලය විසිනි.

- <u>සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.</u>

සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයක් තුළ පැවතිය යුතු වැදගත් මූලධර්මයකි. එය **විධායකයේ ශක්තිමත් භාවයට, ඒකීයභාවයට , රහස්‍යය භාවයට, ස්ථාවරභාවයට අතිශයින්ම වැදගත් කේන්ද්‍රීය සාධකයකි.** <u>සාමූහික වගකීමේ ප්‍රතිපත්තියෙන් සංකේතවත් වන්නේ, කැබිනට් අමාත්‍යවරු පාලන කටයුතු සම්බන්ධයෙන් සාමූහිකව ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට වගකිව යුතු බවයි</u>. එසේ වග නොකියන්නේ නම් විශ්වාසභංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට හැකිය. නමුත් මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් වන 1978 දෙවන ජන රජ ව්‍යවස්ථාව තුළ විශ්වාස භංග යෝජනාවකින් **<u>ජනාධිපතිවරයා ඉවත් කළ නොහැක්කේ ය. එය සුවිශේෂී ලක්ෂණයකි</u>**. මෙම කැබිනට් මණ්ඩලය තුළ සාමූහික වගකීම සතුටු දායක මට්ටමකින් ආරක්ෂා වූයේ නැත.

- <u>සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය බිඳවැටීමට බලපෑ හේතු කිහිපයක් පෙන්වාදිය හැකිය.</u>

  - **සහාග ආණ්ඩු නිර්මාණය වීම.**
  - **සමානුපාතික නියෝජන ක්‍රමය.**
  - **කැබිනට් මණ්ඩලය තුළ ප්‍රාදේශීය - ආගමික - වාර්ගික යන බහුවිධතාවයක් පවතී.**

# ස්ථිර විධායකය

● <u>රාජ්‍ය සේවය හැඳින්වීම.</u>

රජයේ සේවකයින් යනු , <u>ජනාධිපති , මැති ඇමතිවරුන් හැර රජයේ සේවය සම්බන්ධයෙන් වැටුප් ලබන පුද්ගලයන් ය</u>.

නිදර්ශන -: 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව තුළ ජනාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය , අගමැතිවරයා , අමාත්‍යය වරුන් , මන්ත්‍රීවරු ද, කථානායක වරයා ද , පාර්ලිමේන්තුවේ මහ ලේකම් සහ ඔහුගේ කාර්ය මණ්ඩලය ද , අධිකරණසේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ද , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ද හැර රජයේ සේවය සම්බන්ධයෙන් වැටුප් ලබන අය රාජ්‍ය සේවකයින් වන්නේ ය.

**රාජ්‍ය සේවය ස්ථිර විධායකය වේ.** ආණ්ඩුවේ තීරණ ප්‍රතිපත්ති ජනතාව අතර ක්‍රියාවට නගනු ලබන්නේ රාජ්‍ය සේවකයින් ය. එම නිසා එය විධායකයක් වේ. ආණ්ඩු නිතර වෙනස් වුවද රාජ්‍යය සේවය ස්ථාවරව පවතී. එම නිසා එය ස්ථිර සංස්ථාවකි. එම නිසා රාජ්‍ය සේවය ස්ථිර විධායකය ලෙස හඳුන්වයි.

● <u>රාජ්‍යය සේවයේ ස්ථර දෙකක් පවතී.</u>

රාජ්‍ය සේවය

උසස් රාජ්‍ය නිලධාරීන් | අනෙකුත් රාජ්‍ය නිලධාරීන්

01. උසස් රාජ්‍යය නිලධාරීන්

● <u>උසස් රාජ්‍ය නිලධාරීන් හැඳින්වීම.</u>

උසස් රාජ්‍යය නිලධාරීන් ලෙස හඳුන්වනු ලබන්නේ, නීතිපති , විගනකාධිපති , පොලිස්පති, අග්‍රවිනිශ්චකාරවරයා ආදීන් ය. නමුත් ඔවුන් තෝරා පත්කරනු ලබන්නේ පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසිනි. ඒ හැර දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද උසස් රාජ්‍ය නිලධාරීන් වේ.

● <u>උසස් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් හා කටයුතු.</u>

උසස් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන් එනම් , **පත් කිරීම් - මාරු කිරීම් - ඉවත් කිරීම් - විනය පාලනය** <u>අමාත්‍යය මණ්ඩලයට</u> පවරා තිබේ.

| 18 වැනි සංශෝධනය 55 (2) උප වගන්තිය. |
|---|
| **"සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම , උසස් කිරීම , මාරු කිරීම , ඔවුන්ගේ විෂයෙහි විනය පානය කිරීම හා ඔවුන් සේවයෙන් පහ කිරීම අමාත්‍යය මණ්ඩලය වෙත් පැවරෙන්නේ ය."** |

**නමුත්** <u>ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය මත පත් කළ යුතු රාජ්‍ය නිලධාරීන් කිහිපදෙනෙක් 18 වැනි සංශෝධනය තුළ දක්වා තිබේ</u>.

02. අනෙකුත් රාජ්‍ය නිලධාරීන්.

- <u>අනෙකුත් රාජ්‍ය නිලධාරීන් **හැඳින්වීම.**</u>

ඉහතින් දක්වන ලද උසස් රාජ්‍ය නිලධාරීන් හැර අනෙකුත් රාජ්‍ය සේවකයන් උසස් රාජ්‍ය නිලධාරින් ලෙස හැඳින්විය හැකිය.

- <u>අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ **වගකීම් හා කාර්යයන්.**</u>

වගකීම් ⟶ අමාත්‍යය මණ්ඩලය සතු විය.

කටයුතු ⟶ පත් කිරීම් , මාරු කිරීම් , ඉවත් කිරීම් , විනය පාලනය (රාජ්‍යය සේවා කොමිෂන් සභාව සතු විය)

අනිකුත් රාජ්‍ය නිලධාරීන්ගේ <u>**වගකීම්**</u> අමාත්‍යය මණ්ඩලය සතු කර තිබේ. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ සියලුම ප්‍රතිපත්ති කාරණා සඳහා විධි විධාන සැලසීම හා තීරණය කිරීම අමාත්‍යය මණ්ඩලය සතු වේ.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

- <u>රාජ්‍යය සේවා කොමිෂන් සභාව **හැඳින්වීම**</u>.

උසස් රාජ්‍ය නිලධාරීන් හැර <u>අනිකුත් රාජ්‍ය සේවකයන්ගේ</u> **කටයුතු** එනම් , **පත් කිරීම්** , මාරු **කිරීම්** , **ඉවත් කිරීම්** , **විනය පාලනය** සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ස්ථාපනය කළ කොමිෂන් සභාව.

- <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **සංයුතිය.**</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් **9** කි. ජනාධිපති වරයා විසින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණය මත පත් කරයි. කොමිෂන් සභාවේ <u>සාමාජිකයින් 9 දෙනාගෙන් 03 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් වසර 15 කට වඩා රාජ්‍ය නිලධාරීන් ලෙස කටයුතු කළ අයවලුන් විය යුතුය.</u> රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **සභාපතිවරයා** ජනාධිපති විසින් පත් කරනු ලබයි. පසුව කොමිසමේ සාමාජිකයින් විසින් **ලේකම්වරුන්** පත් කර ගත යුත්තේ ය.

- <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **නිලකාලය.**</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලකාලය <u>**වසර 03 කි.**</u> කොමිසමේ සාමාජිකයෙකු ඉල්ලා අස්වීම - ඉවත් කිරීම - මිය යෑම වැනි හේතු මත පුරප්පාඩු ඇතිවුව හොත් ඉතිරි නිල කාලය සඳහා සාමාජිකයෙකු ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය මත තෝරාපත් කරයි.

- <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැටුප් **(වේතන)**</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි. ඒකාබද්ධ අරමුදල මගින් ගෙවනු ලබයි. සේවාකාලය තුළ වැටුප් අඩු නොකල යුත්තේ ය.

- <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **කාර්ය හා බලතල.**</u>

(i) අනෙකුත් රාජ්‍ය සේවකයින්ගේ කටයුතු එනම්, පත් කිරීම් - මාරු කිරීම් - ඉවත් කිරීම් - විනය පාලනය සම්බන්ධයෙන් අමාත්‍යය මණ්ඩලයට සහාය හා උපදෙස් ලබා දීම. මෙම උපදෙස් පිළිගැනීමට අමාත්‍යය මණ්ඩලය බැඳී සිටියේ නැත.

(N.B) 1947 තුළ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ස්වාධීන රාජ්‍ය සේවයක් ස්ථාපනය වී තිබුණි. නමුත් 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවකයින්ගේ වගකීම් හා කටයුතු අමාත්‍යය මණ්ඩලය සතු කලේය. අමාත්‍යය මණ්ඩලයට උපදෙස් හා සහාය වීම පිණිස රාජ්‍ය සේවා උපදේශ මණ්ඩලය හා රාජ්‍ය සේවා විනය මණ්ඩලය ස්ථාපනය කළේ ය. නමුත් 1972 තුළ ස්වාධීන රාජ්‍ය සේවයක් ස්ථාපනය වූයේ නැත. එම නිසා 1978 ආණ්ඩුක්‍රමය මගින් 17 වැනි සංශෝධනය මගින් ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවා රාජ්‍ය සේවය ස්වාධීන කළේ ය. නමුත් 18 වැනි සංශෝධනය මගින් නැවත රාජ්‍ය සේවයේ වගකීම් හා කටයුතු අමාත්‍යය මණ්ඩලය සතු කළේ ය. එම නිසා වර්තමානය තුළ ස්වාධීන රාජ්‍ය සේවයක් දැක ගත නොහැකිය. 1978 තුළ ස්ථාපනය කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පිළිගැනීමට අමාත්‍යය මණ්ඩලය බැඳී නොමැත.

- **රාජ්‍ය සේවය ස්වාධීන වීමේ වාසි.**

1. අසහනයෙන් තොර රාජ්‍ය සේවයක් නිර්මාණය වීම.
2. රාජ්‍ය සේවකයින් දේශපාලන පළිගැනීම් වලට ගොදුරු නොවීම.

- **රාජ්‍ය සේවය ස්වාධීන වීමේ අවාසි.**

1. රාජ්‍ය සේවකයින්ට ආණ්ඩුවේ වැඩකටයුතු අකාර්යක්ෂම කිරීමට , කඩාකප්පල් කිරීමට හැකිවීම.
2. අසහනකාරී පීඩාකාරී රාජ්‍යය සේවයක් ගොඩ නැගීම.

# අධිකරණය

# අධිකරණය

- <u>අධිකරණය හැඳින්වීම.</u>

ව්‍යවස්ථාදායකය විසින් සම්පාදිත විධායකය විසින් ක්‍රියාත්මක නීති විනිශ්චය කරනු ලබන්නේ අධිකරණයයි. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන වගන්තිය අධිකරණය සම්බන්ධ තොරතුරු දැක්වේ. එටස්ම 1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනත අධිකරණය සම්බන්ධ තොරතුරු දක්වයි.

| 105 වගන්තිය | |
|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණය. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනා අධිකරණය , විසින් කලින් කල නියම කොට පිහිටවනු ලැබිය හැකි වෙනත් යම් මූල් අවස්ථා අධිකරණ , විනිශ්චය අධිකරණ හෝ අයතන |

- <u>අධිකරණ පද්ධතිය තුළ ප්‍රධාන ස්ථර දෙකක් හඳුනාගත හැකිය.</u>

අධිකරණ පද්ධතිය

- උසස් අධිකරණ ආයතන
  - ශ්‍රේෂ්ඨාධිකරණය
  - අභියාචනාධිකරණය
  - මහාධිකරණය
- මූල් අවස්ථා උසස් අධිකරණ ආයතන
  - මහාධිකරණය
  - දිසා අධිකරණය
  - මහෙස්ත්‍රාත් අධිකරණය
  - ප්‍රාථමික අධිකරණය

- මෙම අධිකරණ පද්ධතිය ස්ථර **තුනක්** යටතේ ද දැක්විය හැකිය.

අධිකරණ පද්ධතිය

- උසස් අධිකරණ ආයතන
  - ශ්‍රේෂ්ඨාධිකරණය
  - අභියාචනාධිකරණය
- මූල් අවස්ථා උසස් අධිකරණ ආයතන
  - මහාධිකරණය
- මූල් අවස්ථා අධිකරණ ආයතන
  - දිසා අධිකරණය
  - මහෙස්ත්‍රාත් අධිකරණය
  - ප්‍රාථමික අධිකරණය

(N.B) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණය - අභියාචනාධිකරණය සහ මහාධිකරණය ස්ථාපනය කර තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය සතු බලතල <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් වේ.</u> මහාධිකරණය හා මූල් අවස්ථා අධිකරණ සතු බලතල දක්වා තිබෙන්නේ <u>1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනත</u> තුළ ය.

(N.B) 1987 වසරේ <u>13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය</u> මගින් පළාත් මහාධිකරණ ස්ථාපනය කළේ ය.

## <u>අධිකරණයේ ස්වාධීනත්වය.</u>
(**N.B** ආණ්ඩුවේ **tute** එක අධ්‍යයනය කරන්න)

● <u>අධිකරණයේ ස්වාධීනත්වය යනු කුමක්දැයි හැඳින්වීම</u>.

අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ බලපෑමකින් - මැදිහත්වීමකින් - ඇඟිලි ගැසීමකින් තොරව අධිකරණයට නීති විනිශ්චය කිරීමට ඇති හැකියාවයි. අධිකරණයේ ස්වාධීනත්වය රටක කටයුතු සාධාරණව සිදුවීමට විශේෂයෙන් බලපායි.

● <u>අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග</u>.

අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමට පියවර ගනු ලබන ප්‍රධාන අංශ කිහිපයකි.

| | | |
|---|---|---|
| විනිශ්චකාරවරු පත් කරන ආකාරය | - | (පත්කිරීම්) |
| විනිශ්චකාරවරුන්ගේ සේවා කාලය | - | (සේවාකාලය) |
| විනිශ්චකාරවරු ඉවත් කිරීම | - | (ඉවත් කිරීම්) |
| විනිශ්චකාරවරුන්ගේ වැටුප් | - | (වැටුප්) |

● <u>**1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණයේ ස්වාධීනත්වය.**</u>

**උසස් අධිකරණ ආයතනවල ස්වාධීනත්වය**

1978 ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ උසස් අධිකරණ ආයතන වන්නේ **ශ්‍රේෂ්ඨාධිකරණය** හා **අභියාචනාධිකරණයයි.** එම ආයතනවල ස්වාධීනත්වය සම්බන්ධයෙන් ගෙන තිබූ ක්‍රියාමාර්ග.

**පත් කිරීම්** -: උසස් අධිකරණ ආයතනවලට විනිශ්චකාරවරු පත් කරන ලද්දේ පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසිනි.

**සේවා කාලය** -: ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්ගේ සේවා කාලය අවුරුදු 65 කි. අභියාචනාධිකරණයේ විනිශ්චකාර වරයෙකුගේ සේවා කාලය අවුරුදු 63 කි.

**ඉවත් කිරීම** -: පාර්ලිමේන්තුව සරල බහුතරයකින් ගෙන එන යෝජනාවකට ජනාධිපතිවරයාට විනිශ්චයකරුවෙකු ඉවත් කළ හැකිය.

වැටුප් -: විනිශ්චකාරවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කළ යුතු විය. ඒකාබද්ධ අරමුදලින් ගෙවන ලදි. සේවා කාලය තුළ වැටුප් අඩුකළ නොහැකිය.

**උසස් මුල් අවස්ථා අධිකරණ ආයතනවල ස්වාධීනත්වය.**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව උසස් මුල් අවස්ථා අධිකරණය වන්නේ **මහාධිකරණයයි** ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ ක්‍රියා මාර්ග,

**පත් කිරීම්** -: මහාධිකරණයට විනිශ්චකාරවරුන් පත් කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසිනි.

**සේවා කාලය** -: මහාධිකරණ විනිශ්චකාරවරයෙකුගේ සේවා කාලය අවු 61 ලෙස දක්වා තිබේ.

**ඉවත් කිරීම** -: මහාධිකරණයේ විනිශ්චකාර වරයකු ඉවත් කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව ගෙනෙන යෝජනාවකට ජනාධිපතිවරයා ක්‍රියාත්මක විය යුතු ය.

වැටුප් -: මහාධිකරණ විනිශ්චකාරවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කළේ ය. ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය. සේවා කාලය තුළ වැටුප් අඩු කළ නොහැකිය.

මුල් අවස්ථා අධිකරණ ආයතනවල ස්වාධීනත්වය.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මුල් අවස්ථා අධිකරණ ආයතන ලෙස **මහේස්ත්‍රාත් අධිකරණය- දිසා අධිකරණ - ප්‍රාථමික අධිකරණය** ස්ථාපනය කර තිබුණි. එම ආයතනයන්හි ස්වාධීනත්වය සඳහා ගත් ක්‍රියාමාර්ග.

(**N.B**) මුල් අවස්ථා අධිකරණ ආයතනවල **පත් කිරීම් - මාරු කිරීම් - ඉවත් කිරීම් - විනය පාලනය** <u>අධිකරණ සේවා කොමිෂන් සභාවට</u> පවරා තිබේ.

## අධිකරණ සේවා කොමිෂන් සභාව.

- <u>අධිකරණ සේවා කොමිෂන් සභාව හැඳින්වීම</u>.

මුල් අවස්ථා අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම හා විනය පාලනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ස්ථාපනය කළ ස්වාධීන කොමිෂන් සභාවකි.

- <u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය.</u>

අධිකරණ සේවා කොමිෂන් සභාවේ **<u>සාමාජිකයින් 03 කි</u>**. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු සභාවේ අනුමැතිය මත පත් කරයි.

- <u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිල කාලය.</u>

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිල කාලය අවුරුදු 03 කි. පුරප්පාඩු පුරවනු ලැබුවේ ද ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු සභාවේ අනුමැතිය මතය.

- <u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ වේතන (වැටුප්)</u>

අධිකරණ සේවා කොමිසන් සභාවේ සාමාජිකයින්ගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කළ අතර ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය. සේවා කාලය තුළ වැටුප් අඩු නොකළ යුතු යැයි කොන්දේසි පවරා තිබුණි.

මෙම විධිවිධාන මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන කර තිබුණිත එමගින් මුල් අවස්ථා අධිකරණ ආයතනවල ස්වාධීනත්වය ස්ථාපනය කර තිබුණි.

## ශ්‍රේෂ්ඨාධිකරණය

හැඳින්වීම. මොකක්ද? 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ස්ථාපනය කර ඇති උසස්ම අධිකරණ ආයතනය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි.

සංයුතිය <u>අග්‍රවිනිශ්චකාරවරයාගෙන් ද 6 ට නො අඩු 10 නොවැඩි විනිශ්චකාර වරු සංඛ්‍යාවකින් යුක්ත වන්නේ ය.</u> ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු සභාවේ නිර්දේශමත පත් කරයි.

නිලකාලය 1978 ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරවරයෙකුගේ විශ්‍රාමික වයස අවුරුදු 65 ක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබේ.

ඉවත්කිරීම විනිශ්චකාරවරයෙකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව සරල බහුතරයකින් ගෙනෙන යෝජනාවකට ජනාධිපතිවරයා ක්‍රියාත්මක විය යුතු ය.

■ **<u>ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්ය හා බලතල.</u>**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVI පරිච්ඡේදයේ 118 - 136 වගන්ති තුළ ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල සටහන් වේ.

1. **පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ අධිකරණ බලය.**

   මෙයින් විස්තර වන්නේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වී ඇති කෙටුම්පත් හෝ යම් විධිවිධාන ව්‍යවස්ථාවට අනුකූලදැයි ප්‍රශ්නයක් මතු වූ විට ඒ පිළිබඳ තීරණ දීමේ බලයයි.

2. **මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ අධිකරණය බලය.**

   ව්‍යවස්ථාව මගින් විස්තර කොට ඇති මූලික අයිතිවාසිකම් කඩ කිරීම හෝ කඩ කිරීමට ඉතා ආසන්න නම් එවැනි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණ දීමේ බලය මෙයින් විස්තර වේ.

3. **අවසාන අභියාචනාධිකරණ බලය.**

   අභියාචනාධිකරණය හෝ වෙනත් මුල් අවස්ථා අධිකරණ ආයතනයක් යම් සිද්ධියක් පිළිබඳව හෝ සිවිල් හා අපරාධ නඩුවක් පිළිබඳව දෙන ලද තීරණ නැවත අවසාන වශයෙන් සලකා බැලීමේ බලය මෙයින් විස්තර වේ.

4. **උපදේශක අධිකරණ බලය.**

   යම් වැදගත් කමකින් යුත් සිද්ධියක් හෝ නීතියක් පිළිබඳව උපදේශයක් ජනාධිපතිවරයා විසින් ඉල්ලා සිටි විට ඒ පිළිබඳ උපදෙස් දීමේ බලයත් , කථානායකවරයා විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් වී ඇති දෝශාභියෝගය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව

5. **ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් අධිකරණ බලය.**

   ජනාධිපතිවරයා හා ජනමත විචාරණය සම්බන්ධයෙන් ඡන්ද පෙත්සම් විභාග කිරීමේ බලයත් වෙනත් මැතිවරණ පෙත්සම් සම්බන්ධයෙන් අභියාචනා සලකා බැලීම.

6. **පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධ අධිකරණ බලය.**

   පාර්ලිමේන්තුවේ පැවැත්ම හා ස්වාධීනත්වය ද මහජන මන්ත්‍රීවරුන්ගේ ස්වාධීනත්වයද, ආරක්ෂා කිරීම සඳහා ඇති පාර්ලිමේන්තු වරප්‍රසාද මාලාව කඩ කරන අයට දඬුවම් පැමිණවීමට ඇති බලය මෙයින් විස්තර වේ.

7. **පාර්ලිමේන්තුව විසින් පවරන ලද වෙනත් බලතල.**

# මූලික අයිතිවාසිකම්

## මූලික අයිතිවාසිකම්

<u>හැඳින්වීම.</u>

1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය , මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඉතිහාසයේ ප්‍රථම වරට ව්‍යවස්ථාගත කළේ ය. 18(I) උප වගන්තිය ඊට වෙන් කර තිබුණි. ඊට පූර්වයෙන් පැවති **1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පැවතියේ සුළු ජාතික අයිතිවාසිකම් සම්බන්ධ වගන්ති පමණි.** 29(2) (3) (4) වගන්ති නිදසුන් වේ. 1972 ආණ්ඩුක්‍රමය තුළින් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් අන්තර්ගත කළ ද ඒ තුළ දුර්වලතා පැවතුනි. එම නිසා 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මගින්ද මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ව්‍යවස්ථාගත කළේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **III පරිච්ඡේදයේ 10 - 14 වගන්ති ඊට වෙන්කොට තිබේ.** <u>15 වැනි වගන්තිය තුළ ඊට අදාළ සීමාවන් ද 16 , 17 වගන්ති තුළ අයිතිවාසිකම් කඩවූ විට ගත යුතු ක්‍රියා මාර්ගද දක්වා තිබේ</u>.

### 1978 **III** පරිච්ඡේදයේ 10 - 14 වගන්ති
(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආශ්‍රයෙනි)

10. සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

11. කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර , අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

12. (1) නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ ගකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.

(2) කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව , කුලය , ස්ත්‍රී පුරුෂ ‍ෙදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස් කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය.

එසේ වුව ද රජයේ සේවයේ , අධිකරණ සේවයේ , පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධූරයක කාර්ය ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ භාෂාව පිළිබඳ එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළ දී ලබාගත යුතු යයි එවැනි තැනැත්තකුට නියම කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

එසේම තවදුරටත් එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවල දී ඒ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

(3) වර්ගය , ආගම , භාෂාව , කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළෙඳසල්වලට , පොදු භෝජනාගාරවලට, ආපනශාලාවලට , පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු විනෝද ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට , බැඳීමකට , සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේ ය.

(4) කාන්තාවන්ගේ , ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේ ය.

13\. (1) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.

(2) අත් අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චය කාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස , ඒ තැනැත්තා තරවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

(3) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා ගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය.

(4) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස , කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේ ය. එහෙත් විමර්ශයක් පවත්වන තෙක් හෝ නඩු විභාගයක් පවත්වන තෙක් හෝ යම් තැනැත්තකු සිරභාරයට ගැනීම , අත්අඩංගුවේ තබා ගැනීම , රඳවා තබාගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේ ය.

(5) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තකුම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේ ය.

(6) යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු වරදකට වරදකරු නොවිය යුත්තේ ය. තව ද යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත්වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.

යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී එය ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තකු නඩු විභාගයට භාජනය කොට දඬුවම් කිරීමට මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේය.

යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දණ්ඩනය ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම් , ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීමමේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

(7) ආගමික හා විගාමික පනතේ හෝ 1967 අංක 14 දරණ ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳා පනවනු ලබන වෙනත් නීතියක හෝ විධිවිධාන යටතේ කරනු ලබන ඉවත් කිරීමේ නියමයක නැතහොත් රටින් පිට කිරීමේ නියමකය හේතුවෙන් යම් තැනැත්තකු සිර භාරයට ගැනීම , අත් අඩංගුවේ තබා ගැනීම , රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

14. (1) සෑම පුරවැසියකුට ම

(අ) භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට,

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට,

(ඇ) සමාගමයේ නිදහසට,

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදසහට,

(ඉ) එකලාව හෝ අන් අය සමඟ , ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව , තම අගාම , ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන් , පිළිපැදීමෙන් , ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට,

(ඊ) එකලාව හෝ අන් අය හා සමඟ හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට,

(උ) එකලාව හෝ අන් අය හා සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක , වෘත්තියක , කර්මාන්තයක , වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට,

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම ඊමේ නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට, සහ

(එ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය.

(2) වෙනත් යම් කිසි රටක පුරවැසියකු ව නොසිටිය දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිර සහ නීත්‍යානුකූල පදිංචිව සිටියා වූ සහ එසේ දිගටම පදිංචිව සිටින්නා වූ තැනැත්තකුට ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ සිට අවුරුදු දහයක කාලයක් තුළ මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලැබූ ඇති අයිතිවාසිකම් වලට හිමිකම් ඇත්තේ ය.

- මෙම මූලික අයිතිවාසිමක් පරිච්ඡේදය තුල හඳුනාගත හැකි වැදගත්කම් හා දුර්වලතාවයන්.

<u>වැදගත්කම් ,</u>

(i) <u>මූලික අයිතිවාසිකම් වලට නෛතික රැකවරණයක් ලබාදී තිබීම.</u> එනම් , මූලික අයිතිවාසිකම් කඩවීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පැතීමට හැකි වීම.

(ii) <u>10 හා 11 වගන්තිවලින් දක්වන ලද අයිතිවාසිකම් සඳහා කිසිදු සීමාවක් දක්වා නොමැත.</u> එසේම එම වගන්ති සංශෝධනය කිරීමට ව්‍යවස්ථාදායකයේ 2/3 ක විශේෂ බහුතර අනුමැතියක් අවශ්‍ය වීම.

(iii) පුරවැසි අයිතිවාසිකම් යන සීමාවෙන් ඔබ්බට ගමන්කර ලංකාවේ ජීවත්වන සෑම අයෙක්ටම සුරක්ෂාව ලබා දී තිබීම.

(iv) කාන්තාවන් , ළමයින් , දුබල තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ රැකවරණයක් ලබා දී තිබීම.

(v) මූලික අයිතිවාසිකම් වලට ව්‍යවස්ථාව තුළ වැදගත් ස්ථානයක් හිමි කර දී තිබීම.

(vi) 1972 මූලික අයිතිවාසිමක් පරිච්ඡේදයට වඩා පුළුල් විස්තරාත්මක ස්වරූපයකින් අයිතිවාසිකම් විස්තර කොට තිබීම.

(vii) අයිතීන් සීමා කරන , පුළුල් සීමාවක් දක්වා නොතිබීම , සහ ඒ ඒ අයිතියට ඇති සීමාවන් වෙන වෙනම දක්වා තිබීම.

(viii) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් තවත් ක්‍රියාමාර්ග ගෙන තිබීම. එනම්, මානව හිමිකම් , ඔම්බුඩ්ස්මන් , එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංගමය ආදිය භාවිතා කළ හැකි වීම.

<u>දුර්වලතා,</u>

(i) ජීවත්වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස දක්වා නොමැති බව.

(ii) දින 30 ක් ඇතුළත් අයිතීන් කඩවීම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යා යුතු වීම.

(iii) හදිසි නීතිය වැනි තත්ත්වයන් ක්‍රියාත්මක වීම.

(iv) ත්‍රස්ථවාදය වැලැක්වීම පනත යටතේ පුද්ගලයන් රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමට හැකි වීම.

(v) වගකීමෙන් නිදහස් වීම වැනි පනත් අක්‍රියව මුත් ව්‍යවස්ථාව තුළ තවමත් පැවතීම.

(vi) අයිතීන් කඩ වූ පුද්ගලයාට නඩු පැවරිය යුතු වීම.

(vii) ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක් මූලික අයිතීන් පිළිබඳ නඩු විභාග කිරීමේ බලය ලබා දී තිබීම.

ඔම්බුඩ්ස්මන්වරයා

# ඔ ම්බුඩ්ස්මන්වරයා
## (පාරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්)

හැඳින්වීම කවුද

ඔම්බුඩ්ස්මන් ධූරය 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ නවාංගයකි. දුක්ගන්නාරාල , පාරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා යන අන්වර්ථ නාමයන් මගින් ද හඳුන්වනු ලබන්නේ ඔම්බුඩ්ස්මන්වරයාම ය.

ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධයෙන් සඳහන් වගන්ති හා පනත්.

- **1978 ව්‍යවස්ථාවේ 156 වගන්තිය.**
- **1981 අංක 17 දරණ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත හා 91 අංක 20 දරණ පනත.**
- **1994 අංක 26 දරණ සංශෝධන පනත.**

පත්කිරීම

ඔම්බුඩ්ස්මන් වරයා පත්කරනු ලබන්නේ පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණය මත ජනාධිපතිවරයා විසිනි.

නිලකාලය

ඔම්බුඩ්ස්මන් ධූරයේ විශ්‍රාමික වයස අවුරුදු 70 කි.

ඉවත්කිරීම

පාර්ලිමේන්තුව සරල බහුතරයකින් සම්මත කොට ඉදිරිපත් කළ යෝජනාවකට අනුව ජනාධිපතිවරයාට ධූරයෙන් ඉවත් කළ හැකිය.

**ඔම්බුඩ්ස්මන් ධූරයේ පුරප්පාඩු ඇතිවිය හැකි අවස්ථා කිහිපයකි.**

(i) මිය ගිය විට.
(ii) ජනාධිපතිවරයා වෙතයවන ලද ලිපියකට අනුව ඉල්ලා අස් වීම.
(iii) විශ්‍රාම ගිය විට.
(iv) රෝගාතුර වීම , ශාරීරික ආබාධයක් , මානසික දුර්වලතාවයක් නිසා ජනාධිපතිවරයා විසින් ඉවත් කළ විට.
(v) පාර්ලිමේන්තුව ගෙන එන යෝජනාවකට අනුව ජනාධිපතිවරයා විසින් ධූරයෙන් පහ කිරීම.

වැටුප්

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කරයි. ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබයි. සේවාකාලය තුළ වැටුප් අඩු නොකළ යුතු බවට කොන්දේසි පවරා තිබේ.

- ඔම්බුඩ්ස්මන්වරයාගේ **කාර්ය හා බලතල.**

(i) **මූලික අයිතීන් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් ඉදිරිපත්වන පැමිණිලි විභාග කොට වාර්තා කිරීම.**

විශේෂයෙන් රජයේ දෙපාර්තමේන්තුවක , සංස්ථාවක , පළාත් පාලන ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක නිලධාරියකුගෙන් යම් අසාධාරණයක් හෝ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදු වූ විට ඒ සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන් වරයාට පැමිණිලි කළ හැකිය. එවැනි පැමිණිලි පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම ඔම්බුඩ්ස්මන් වරයා සතු කාර්ය භාර්යය වේ.

- <u>ඔම්බුඩ්ස්මන් වරයා වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය.</u>

රටේ ඕනෑම පුද්ගලයෙකුට රාජ්‍ය ආයතනයක නිලධරයෙකුගෙන් අයිතිවාසිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

**I** ක්‍රමය

පැමිණිල්ල ⟶ පාර්ලිමේන්තුව හරහා යැවීම

**II** ක්‍රමය (1994 පසුව)

පැමිණිල්ල ⟶ සෘජුව ඔම්බුඩ්ස්මන්වරයාට යොමු කිරීම.

1994 පූර්ව අවධිය තුළ ඔම්බුඩ්ස්මන් වරයා වෙත සෘජුව පැමිණිලි වාර්තා කිරීමට නොහැකි විය. එය පාර්ලිමේන්තුව හරහා යැවීමට සිදු විය. එනම් , **<u>පැමිණිලිකාර පුරවැසියා තම පැමිණිල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මගින් පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරකසභාවට ඉදිරිපත් කළ යුතු ය. පසුව මහජන පෙත්සම් කාරකසභාව විසින් එම පෙත්සම (පැමිණිල්ල) ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කරයි.</u>**

## <u>නමුත් ,</u>

1994 දී සිදු කළ සංශෝධනයට අනුව **<u>පැමිණිලිකරුට සෘජුව ස්වකීය පැමිණිල්ල (පෙත්සම) ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දුන්නේ ය</u>**.

### <u>1994 පෙර,</u>

ඔම්බුඩ්ස්මන්වරයා එම පැමිණිල්ල විභාග කර බලා ඔම්බුඩුස්මන් වරයාගේ වාර්තාව මහජන පෙත්සම් කාරක සභාවට යැවිය යුත්තේ ය.

### <u>1994 පසු,</u>

ඔම්බුඩ්ස්මන්වරයා පැමිණිල්ල විභාගකර බලා ඔහුගේ වාර්තාව මහජන පෙත්සම් කාරක සභාවට ද, එම නිලධාරියා අයත් ආයතන ප්‍රධානියාට ද , එම ආයතනය අයත් විෂ භාර අමාත්‍යවරයාට ද යැවිය යුත්තේ ය. පසුව අදාළ ආයතන ප්‍රධානියා මේ සම්බන්ධයෙන් ගනු ලබන තීරණය ඇතුළත් වාර්තාවක් ඔම්බුඩ්ස්මන් වරයාට යැවිය යුත්තේ ය. අදාළ ආයතන ප්‍රදානියා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවූ විට ඔම්බුඩ්ස්මන් වරයා ස්වකීය වාර්තාව ජනාධිපතිවරයාටත් පාර්ලිමේන්තුවටත් යොමු කළ යුත්තේ ය.

<u>වාසි (යහපත්භාවය)</u>

(i) නිලධාරීන්ගෙන් ජනතාවට සිදුවන අපහසුතා , අයිතිවාසිකම් උල්ලංඝණය වීම් වලට ක්‍රියා මාර්ග ගත හැකි වීම.
(ii) නිලධාරීන් වඩා අවධානයෙන් සහ කාර්යක්ෂමව කටයුතු කිරීමට පෙළඹීම.

අවාසි (දුර්වලතා)

(i) ජනතාව සතු නොදැනුවත් භාවය.
(ii) නිලධාරීන්ට අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට මහජනතාවට හැකි වීම.

# ஜனமத விசாரணய

## ජ නමත විචාරණය

<u>හැඳින්වීම.</u>

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් නවාංගයක් ලෙස ජනමත විචාරණය හඳුනාගත හැකිය. මෙය **සෘජු ප්‍රජාතන්ත්‍රවාදී** උපක්‍රමයකි. <u>85 - 87 වගන්ති තුළ සහ 1981 ජනමත විචාරණ පනත තුළත් මේ පිළිබඳ විස්තර දැක්වේ</u>.

> **ජනමත විචාරණයක් යනු,**
>
> **ආණ්ඩුව පැනවීමට අපේක්ෂා කරන වැදගත් නීතියක් හෝ ප්‍රතිපත්තියක් නැතිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ගෙන එන යෝජනාවක් මහජනතාවට ඉදිරිපත් කොට ඒ සඳහා ජනතාව දක්වන ප්‍රතිචාරය නැතිනම් දරණ මතට කුමක් ද යන්න මැන බැලීමය.**

<u>කැඳවීම.</u>

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ලංකාවේ <u>ජනමත විචාරණ කැඳවීමේ බලය හිමිව ඇත්තේ විධායක ජනාධිපතිවරයාට ය.</u> ජනාධිපතිවරයා ජනමත විචාරණ කැඳවනු ලබන අවස්ථා දෙකකි.

1. **අනිවාර්යය ජනමත විචාරණ අවස්ථාව**
2. **සමාන්‍යය ජනමත විචාරණ අවස්ථාව.**

### 1. <u>අනිවාර්යය ජනමත විචාරණ අවස්ථාව.</u>

ජනාධිපතිවරයා විසින් අනිවාර්යයෙන් ජනමත විචාරණයක් කැඳවීමට බැඳී සිටින අවස්ථාවක් තිබේ.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 30 (2) , 62 (2) වගන්ති සංශෝධනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයක් (2/3) අමතරව ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. එවිට ජනමත විචාරණයක් අනිවාර්යයෙන් කැඳවීමට ජනාධිපතිවරයාට සිදු වේ.

<u>1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ.</u>

1 වගන්තිය -: ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී , ස්වාධීන , ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී <u>ජනරජයකි</u>. ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජය <u>ඒකීය රාජ්‍යකි</u>.

3 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජයේ <u>පරමාධිපත්‍යය</u> ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය.

6 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජයේ <u>ජාතික කොඩිය</u>. දෙවන උප ලේඛනයෙහ නිරූපිත සිංහ කොඩිය වන්නේ ය.

7 වගන්තිය -: ශ්‍රී ලංකා ජන රජයේ <u>ජාතික ගීය</u> 'ශ්‍රී ලංකා මාතා' ගීය වන්නේ ය. ජාතික ගීයේ පදමාලාව සහ සංගීතය තුන්වන උපලේඛනයෙහි දැක්වෙන්නේ ය.

8 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජයේ ජාතික දිනය පෙබරවාරි මස හතර වන දිනය වන්නේ ය.

9 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්‍ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

10 වගන්තිය -: සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදසහට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

11 වගන්තිය -: කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර , අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

30 (2)
උප වගන්තිය -: ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

62 (2)
උප වගන්තිය -: සෑම පාර්ලිමේන්තුවක් ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් සාවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේ ය. එහෙත් නියමිත කාලසීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ය. එකී සාවුරුදු කාලය ඉකුත්ව ගිය විට පාර්ලිමේන්තුව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය.

(ii) අමාත්‍යය මණ්ඩලය ඉල්ලා සිටි විට ජනාධිපතිවරයා ජනමත විචාරණයක් කැඳවීමට බැඳී සිටී.

(iii) ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ විට ජනමත විචාරණයක් කැඳවීමට ජනාධිපතිවරයා බැඳී සිටී.

## 2. සාමාන්‍යය ජනමත විචාරණ අවස්ථාව.

ජනාධිපතිවරයාට අවශ්‍ය නම් ජනමත විචාරණයක් කැඳවිය හැකිය. **යම් ජාතික වශයෙන් වැදගත් කමකින් යුක්ත නීතියක් . ප්‍රතිපත්තියක් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව සම්පාදනය නොකරන්නේ නම් එවැනි තත්ත්වයක දී ජනමත විචාරණයක් මගින් ස්වකීය අවශ්‍යතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ජනමත විචාරණයක් කැඳවිය හැකිය**.

(N.B) නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරන නීතියක් හෝ පනතක් හෝ ප්‍රතිපත්තියක් නොවිය යුත්තේ ය.

<u>ජනමත විචාරණය පැවැත්වීම.</u>

විධායක ජනාධිපතිවරයා විසින් කැඳවනු ලබන ජනමත විචාරණය පවත්වනු ලබන්නේ <u>මැතිවරණ කොමසාරිස්වරයා</u> විසිනි.

ජනමතය දැනගැනීම සඳහා අධිකරණ කරන ප්‍රතිපත්තිය ජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන්නේ **<u>ප්‍රශ්නයක</u>** ආකාරයෙනි. ජනතාව එම යෝජනාව සඳහා

**පක්ෂ ද?**
**විපක්ෂ ද?**

යන්න පරීක්ෂා කර බලයි. ජනතාව ඒ සඳහා,

**පක්ෂ නම්** - **'ඔව්' යනුවෙන් ද**
**විපක්ෂ නම්** - **'නැත' යනුවෙන් ද**

(N.B) සටහන් කළ යුතු ය. පක්ෂ 'ඔව්' යන්නට අදාළ සංචිතය **<u>'ලාම්පුව'</u>** වේ. විපක්ෂ 'නැත' යන්න අදාළ සංචිතය **<u>'කලය'</u>** වේ.



<u>ප්‍රතිඵල ප්‍රකාශ කිරීම.</u>

ජනමත විචාරණයේ ප්‍රතිඵල නිකුත් කිරීමේ දී ජනතාව විසින් එය අනුමත කර ඇතැයි සලකනු ලබන අවස්ථා දෙකක් සඳහන් වේ.

(I) **රටේ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 2/3 ක් ඡන්දය ප්‍රකාශ කර ඇති අවස්ථාවක දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් 1/2 ක් පක්ෂ වී ඇති විට** ජනතාව යෝජනාව අනුමත කර ඇති බව ප්‍රකාශයට පත් කරයි.

(II) **රටේ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 2/3 ක් ඡන්ද දී නැති විට ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 1/3 ක් පක්ෂව ඡන්ද ප්‍රකාශ කර ඇතිවිට** ජනතාව යෝජනාව අනුමත කර ඇති බව ප්‍රකාශ කරයි.

මෙම අවස්ථා දෙකේ දී ජනතාව විසින් එම යෝජනාවට එකඟත්වය පල කර ඇති බව ප්‍රකාශයට පත් කරයි.

**<u>ජනමතය නීතියක් බවට පත්වීම.</u>**

ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කළ යෝජනාවකට ජනාධිපතිවරයා අත්සන් කිරීමත් සමඟ නීතියක් බවට පත් වේ.

ජනමත විචාරණ සම්බන්ධයෙන් පෙත්සම් ඉදිරිපත් කළ හැකිය. ඒවා පරීක්ෂා කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන්නේ ය.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය

## ආ ණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ විධි විධාන.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හඳුන්වන්න.
  (N.B - ආණ්ඩුව tute එක බලන්න)

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන යනු කුමක්දැයි හඳුන්වන්න.</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන යනු ව්‍යවස්ථාවේ කිසියම් විධිවිධානයක් වෙනස් කිරීම යම් විධි විධානයක් අලුතින් එකතු කිරීම හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්චින්න කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීමයි.

- <u>1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය.</u>

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. එනම්, ව්‍යවස්ථායකයේ සරල බහුතරයකින් 1/2 කින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ නොහැකිය. ඒ සඳහා විශේෂ ක්‍රියාමර්ග ගත යුතුව ඇත.

- **ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ (2/3) ක අනුමැතිය.**
- **ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය.**

**<u>I ක්‍රමය.</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 , 7 , 8 , 9 , 10 , 11 , 30 (2) , 62 62) වන වගන්ති හැර සෙසු වගන්ති ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තදුවේ විශේෂ බහුතරයකින් (2/3 කින්) සංශෝධනය කළ හැකිය.

**<u>II ක්‍රමය.</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 , 2 , 3 , 6 . 7 , 8 , 9 , 10 , 30 (2) , 62 (2) යන වගන්ති සංශෝනය සඳහා පාර්ලිමේන්තුවේ (2/3) විශේෂ බහුතර අනුමැතියට අමතරව ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය අවශ්‍ය වේ.

| | | |
|---|---|---|
| 1 වගන්තිය | -: | ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී , ස්වාධීන , ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ. |
| 2 වගන්තිය | -: | ශ්‍රී ලංකා ජනරජය ඒකීය රජයකි. |
| 3 වගන්තිය | -: | ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය. |
| 6 වගන්තිය | -: | ශ්‍රී ලංකා ජනරජයේ ජාතික කොඩිය. දෙවන උප ලේඛනයෙහ නිරූපිත සිංහ කොඩිය වන්නේ ය. |
| 7 වගන්තිය | -: | ශ්‍රී ලංකා ජන රජයේ ජාතික ගීය 'ශ්‍රී ලංකා මාතා' ගීය වන්නේ ය. ජාතික ගීයේ පදමාලාව සහ සංගීතය තුන්වන උපලේඛනයෙහි දැක්වෙන්නේ ය. |
| 8 වගන්තිය | -: | ශ්‍රී ලංකා ජනරජයේ ජාතික දිනය පෙබරවාරි මස හතර වන දිනය වන්නේ ය. |

9 වගන්තිය -: ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

10 වගන්තිය -: සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදසහට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

11 වගන්තිය -: කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර , අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

30 (2)
උප වගන්තිය -: .........................................................................................................................
.........................................................................................................................
.........................................................................................................................

උප වගන්තිය -: සෑම පාර්ලිමේන්තුවක් ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් සාවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේ ය. එහෙත් නියමිත කාලසීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ය. එකී සාවුරුදු කාලය ඉකුත්ව ගිය විටම පාර්ලිමේන්තුව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය.

● <u>ව්‍යවස්ථා සංශෝධනයන්ට නිදර්ශන.</u>

මෙම ආකාරයට නීතිය අනුව අනම්‍යය පදනමක ව්‍යවස්ථා සංශෝධන විධිවිධාන රඳවා තිබේ. <u>නමුත් ප්‍රායෝගික භාවිතය තුළ 1978 සිට මේ වන විට ව්‍යවස්ථාව අවස්ථා 18 ක දී සංශෝධනය වී තිබේ</u>.

නිදර්ශන -:

| | | | |
|---|---|---|---|
| I | සංශෝධනය | - | 1978 නොවැම්බර් 20 |
| II | සංශෝධනය | - | 1978 පෙබරවාරි 26 |
| III | සංශෝධනය | - | 1982 අගෝස්තු 27 |
| IV | සංශෝධනය | - | 1982 දෙසැම්බර් 23 |
| V | සංශෝධනය | - | 1983 පෙබරවාරි 25 |
| VI | සංශෝධනය | - | 1983 අගෝස්තු 03 |
| VII | සංශෝධනය | - | 1983 ඔක්තෝම්බර් 04 |
| VIII | සංශෝධනය | - | 1984 මාර්තු 06 |
| IX | සංශෝධනය | - | 1984 අගෝස්තු 24 |
| X | සංශෝධනය | - | 1986 අගෝස්තු 06 |
| XI | සංශෝධනය | - | 1987 මැයි 06 |
| XII | සංශෝධනය | - | ක්‍රියාත්මක නොවීය. |
| XIII | සංශෝධනය | - | 1987 නොවැම්බර් 14 |
| XIV | සංශෝධනය | - | 1988 මැයි 24 |
| XV | සංශෝධනය | - | 1988 දෙසැම්බර් 17 |
| XVI | සංශෝධනය | - | 1988 දෙසැම්බර් 17 |
| XVII | සංශෝධනය | - | 2001 ඔක්තෝම්බර් 03 |
| XVIII | සංශෝධනය | - | 2010 දෙසැම්බර් 09 |

**(N.B)** මෙම ආකාරයට ප්‍රායෝගික භාවිතය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍යය ස්වභාවයක් දරණ බව පැහැදිලි වේ. <u>1978 - 1989 අතර වසර 11 ක කාල පාරාසය තුළ 16 වතාවක් ව්‍යවස්ථාව සංශෝධනයට ලක්කර තිබේ</u>.

## 17 වන ව්‍යවස්ථා සංශෝධනය

පාලකයාගේ බලතල සීමා කිරීමට කිසියම් සංවරණයක් ඇති කිරීමේ අරමුණ 17 වන ව්‍යවස්ථා සංශෝධනය සිදු කර ඇත.

විශේෂයෙන් පසුගිය කාලයේ පොලීසිය , අධිකරණය , රාජ්‍යය සේවය සහ මැතිවරණ සම්බන්ධයෙන් සිදුවන දේශපාලන බලපෑම් පිළිබඳව විවේචනය ඉදිරිපත් වූ අතර මේ නියම මෙම ආයතන කෙරෙහි මහජන විශ්වාසය විශාල ලෙස බිඳ වැටීමකට ලක්විය. ජාත්‍යන්තර වාර්තාවක් වාර්තා කරන පරිදි ලංකාවේ දූෂිතම ආයතන වන්නේ පොලීසිය සහ අධිකරණයයි. මේ තත්ත්වය වෙනස් කොට දේශපාලන බලපෑම් වලින් තොරව මෙම ආයතන පවත්වා ගැනීම සඳහා 2001 ඔක්තෝම්බර් මාසයේ දී 17 වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කර ඇත.

17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතිකළ ප්‍රධානම ආයතනය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවයි.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

**සංයුතිය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයන් දස දෙනෙකු ඇතුළත් වේ. එහි සභාපතිවරයා වන්නේ කථානායකවරයායි. අගමැතිවරයා , කථානායකවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා නිලබලයෙන් සාමාජිකයන් ලෙස පත් වේ. ඉතිරි සාමාජිකයන් හත් දෙනා පත් කරගන්නා ක්‍රමවේදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇත.

1. ජනාධිපති පත් කරන එක් අයෙක්
2. අගමැති හා විරුද්ධ පක්ෂයේ නායකයාගේ එකඟතාවය මත ජනාධිපති පත් කරන පස්දෙනෙක්
3. අගමැති හා විරුද්ධ පක්ෂයේ නායකයා අයත් නොවන පාර්ලිමේන්තුවේ කුඩා දේශපාලන පක්ෂවල මන්ත්‍රීන්ගේ බහුතර යෝජනාව මත ජනාධිපති පත් කරන එක් අයෙක්.

**සාමාජික සුදුසුකම්**

නිලබලයෙන් පත්වන තිදෙනා හැර අනෙක් හත්දෙනා එම ධූරයන්ට පත්වීමට මූලික අවශ්‍යතා 04 ක් සම්පූර්ණ කළ යුතු ය.

1. විශිෂ්ටත්වයෙන් යුතු තැනැත්තෙකු වීම.
2. අවංකභාවයෙන් යුතු තැනැත්තෙකු විම.
3. කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයෙකු නොවීම.



ධූර කාලය

සාමාන්‍යය ධරකාලය වසර 3 කි. කෙසේ වෙතත් , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විස්තර කර ඇති හේතුමත එම වසර 3 කාලය ඉකුත් වීමට පෙර යම් සාමාජිකයකුව ධූරයෙන් ඉවත් කළ හැකිය.

**ධූරයෙන් නෙරපීම.**

ධූරයෙන් නෙරපීම සිදුවන අවස්ථා සහ ක්‍රම ගණනාවකි.

1. සාමාජිකයා ධූරයේ කටයුතු කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික දුර්වලතාවයකට පත් වී ඇති විට අගමැතිවරයා සහ විපක්ෂ නායකවරයා යන දෙදෙනාම එකඟවන අවස්ථාවක ජනාධිපති විසින් ඉවත් කිරීම.

2. සාමාජිකයාව චරිත දූෂණය හා සම්බන්ධ වරදක් පිළිබඳව අධිකරණයක් මගින් වරදකරු කිරීම.

3. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන යෝජනාවක් මගින් අදාළ සාමාජිකයාගේ ප්‍රජා අයිතිය අහිමි වීම.

**(N.B) ජනාධිපතිවරයා තම තනි අභිමතයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සමාජිකයෙකුව ඉවත් කළ නොහැකි බව විශේෂයෙන් සැලකිය යුතු ය.**

කාර්ය හා බලතල

1. ජනාධිපතිවරයාගේ ඇතැම් පත් කිරිම් සඳහා අනුමැතිය දීම , එක් කාර්යය හා බලතලයකි. විශේෂයෙන් මෙම පත් කිරීම් ජනාධිපතිවරයා සිදු කළ යුත්තේ ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මතය.

    1. නීතිපතිවරයා
    2. විගණකාධිපතිවරයා
    3. පොලිස්පතිවරයා
    4. ඔම්බුඩ්ස්මන්වරයා
    5. පාර්ලිමේන්තු කොමසාරිස්වරයා
    6. අග්‍රවිනිශ්චකාරවරයා සහ අනෙකුත් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවරු.
    7. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හැර සෙසු සාමාජිකයන්

මෙම පත් කිරීම් කිරීමට පෙර ජනාධිපති විසින් තමන්ගේ නිර්දේශ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතු ය. ජනාධිපතිවරයාගේ එම නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන්නේ නම් පමණක් එම පුද්ගලයන්ව අදාළ ධූර වලට පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත. ජනාධිපතිගේ නිර්දේශ ව්‍යවස්ථා සභාව අනුමත නොකරන විට ඒ සඳහා සිදුසු වෙනත් නම් , එම සභාව වෙත ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයාට සිදු වේ.

2. **ජනාධිපතිවරයාගේ ඇතැම් පත් කිරීම් සිදු කළ යුත්තේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මතය.**

    එනම්,

    1. රාජ්‍යය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    2. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    4. මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    5. මුදල් හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    6. මැ.කො.සීමා.නිර් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.
    7. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.

ස්වාධීන කොමිෂන් සභා සඳහා සාමාජිකයන් පත් කිරීම සහ ඒවායේ සභාපතිවරු නම් කිරීම ජනාධිපතිවරයා විසින් කළ යුතු ය. නමුත් එලෙස ජනාධිපතිවරයාට පත් කළ හැක්කේ එම කොමිෂන් සභාවල සාමාජිකයන් ලෙස පත්විය යුතු තැනැත්තන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාව විසින් නිර්දේශ කළ තැනැත්තන්ට පමණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කරන නම් ජනාධිපති විසින් ප්‍රතික්ෂේප කළ හැකි වන අතර එවිට සුදුසු වෙනත් තැනැත්තන්ගේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු ඇති බවට අපේක්ෂා කරනු ලැබේ.

**රැස්වීම් පැවැත්වීම.**

සභාවේ ලේකම්වරයෙකු සිටින අතර ඔහුව සභාව විසින් ම පත්කර ගනු ලැබේ. සභාපතිවරයාගේ විධායනය මත ලේකම්වරයා විසින් ගස්වීම් කැඳවනු ලබයි. ගස්වීමක් සඳහා සනපූර්ණ 06 කි. සභාවේ තීරණ ඒකමතිකව සිදු කිරීමට උත්සාහ කළ යුතු බව ව්‍යවස්ථාවේ දක්වා ඇත. නමුත් , ඒකමතිකව නොව විට ඡන්දයක් පැවැත්විය හැකිය. යම් යෝජනාවක් සම්මත වීම අවම වශයෙන් සාමාජිකයන් පස් දෙනෙකුවත් එම යෝජනාවට පක්ෂව ඡන්දය දිය යුතු ය. සභාපතිවරයාට ඡන්දය පාවිච්චි කිරීමට බලය ඇත්තේ යම් යෝජනාවක් සඳහා සමසවම ඡන්දය ලැබුණු විට පමණකි.

**අකර්මණ්‍යවීම.**

ඉමහත් බලාපොරොත්තු සහිතව පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එක්වරක් පමණක් පත්කරන ලද අතර එම සභාවේ වසර 3 ක ධූරය කාලය අවසන් වූ විට එහි සාමාජිකයන් (නිලබලයෙන් පවත්වන තිදෙනා හැර) පත් කිරීමට වර්තමාන ජනාධිපතිවරයා අපොහොසත් විය. ජනාධිපතිවරයා විසින්ම චේතනාන්විතව නිර්මාණය කළ රික්තය තුළ , ජනාධිපතිවරයාට රිසි ලෙස 17 වන සංශෝධනය නොතකා කටයුතු කිරීමට ඉඩ නොදී , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සඳහා සාමාජිකයන් පත්කරන ලෙසට ජනාධිපතිවරයා වෙත බලපම් කිරීමට භේදයක් නොමැතිව සිවිල් සමාජය සතු වගකීමකි.

ප්‍රධානම ආයතනය ව්‍යවස්ථා සභාව වුවද තවදුරටත් මැතිවරණ කොමිෂන් සභාව වැනි නව ආයතන හඳුන්වා දුන් අතර , තවදුරටත් රාජ්‍යය සේවය , අධිකරණ වැනි අංශ වල තවත් වෙනස්කම් සිදු කිරීමට යෝජනා කර ඇත.

## 18 වන ව්‍යවස්ථා සංශෝධනය.

78 ව්‍යවස්ථාව මගින් හඳුන්වාදී තිබූ තත්ත්වය වෙනස් කොට පාලකයාගේ බලය හීන කිරීමටත් , අධිකරණ , රාජ්‍යය සේවය හා මැතිවරණ යන අංශවල ස්වාධීන හා සාධාරණ තත්ත්වයක් ඇති කිරීමට 17 වන සංශෝධන හඳුන්වා දෙන ලදි. එහෙත් එය හඳුන්වාදීමේ දී පැවති නීතිමය තත්ත්වය තුළ තිබූ දුර්වලතා සහ පාලකයා හිතාමතාම එය අක්‍රීය කිරීමට උත්සාහ ගැනීම නිසා 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දී තිබූ වැඩසටහන් අක්‍රීය වී තිබුණි. එම අක්‍රීය තත්ත්වය ක්‍රියාකාරී කිරීම සඳහා යයි ප්‍රකාශ කරමින් 18 වන සංශෝධනය ක්‍රියාවට නංවයි. එහෙත් 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් , 17 වන සංශෝධනය මගින් ඇතිකරන්නට ගත් ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අක්‍රීය කොට තිබේ.

2010 දී එක්සත් ජනතා නිදහස් සංධානය සම්මත කොට 18 වන සංශෝධනය ක්‍රියාත්මක කර තිබේ. එමගින් ,

1. ජනාධිපති ධූරයට යම් පුද්ගලයෙකුට පත්විය හැකි වාර ගණන 2 කට සීමා කර තිබූ අතර , එය ඉවත් කොට එක් පුද්ගලයෙකුට දිගමට ජනාධිපති ධූරය දැරීමට අවස්ථාව හිමිකර දෙයි.
   (31 - 2 බවත් කිරීම)

2. තම ඕනෑම ධූර කාලයක අවු. 4 ගෙවුන පසු ජනාධිපතිවරණයකට ඉදිරිපත් වීමට හැකි වීම.
   (31 - 3 අ (i) සංශෝධනය කිරීම)

3. ජනාධිපතිවරයා තුන් මසකට වරක් පාර්ලිමේන්තුවට සහභාගී වීම. (32 සංශෝධනය කිරීම)

4. පාර්ලිමේන්තු සභාව.
   17 වන සංශෝධනයෙන් පිහිටවූ ව්‍යවස්ථා සභාව අහෝසි කොට 18 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තු සභාව පිහිටුවයි.

**සංයුතිය.**

1. අගමැති

2. කථානායක

3. විරුද්ධ පක්ෂයේ නායක

4. පාර්ලිමේන්තු මන්ත්‍රීන් (2) දෙදෙනෙක්

   ඉහත තුන්දෙනා නියෝජනය නොවන ජනවර්ග කිරීම සඳහා විපක්ෂ නායකවරයා එක් අයෙක් ද , අගමැති එක් අයෙක් ද පත් කළ යුතු ය.

   පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති විට නව පාර්ලිමේන්තුවකින් නව ධූර තෝරාගන්නා තෙක් කලින් ධූර දැරූ අයට පාර්ලිමේන්තු සභාවේ කටයුතු කරයි.

**කාර්යභාරය (පළමු උපලේඛනය)**

1. මැතිවරණ කොමිෂන් සභාව
2. රාජ්‍යය සේවා කොමිෂන් සභාව.
3. ජාතික පොලිස් කොමිෂන් සභාව
4. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභාව.
5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
6. මුදල් කොමිෂන් සභාව
7. සීමා නිර්නය කොමිෂන් සභාව

(දෙවන උපලේඛනය)

1. අග්‍ර විනිශ්චකාරවරයා හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරවරු

2. අභියාචනාධිකරණයේ සභාපති හා විනිශ්චකාරවරු

3. අධිකරණ සේවා කොමිසන් සභාවේ සභාපති හැර අනෙකුත් සාමාජිකයන්

   (i) නීතිපති
   (ii) විගනකාධිපති
   (iii) ඔම්බුඩ්ස්මන් වරයා
   (iv) පාර්ලිමේන්තු ලේකම්

යන පත්කිරීම් ජනාධිපති සිදුකරන අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තු සභාවෙන් විමසා බලනු ලබයි. එහි දී ජනාධිපතිට උපදෙස් දීම පාර්ලිමේන්තු සභාව සතු කාර්යභාරයයි.